

පරිසර අමාත්‍යාංශය
சுற்றாடல் அமைச்சு
Ministry of Environment

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024
வருடாந்த செயலாற்றுகை அறிக்கை - 2024
Annual Performance Report - 2024

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ.පෙ.14, පේරාදෙණිය
தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம், த.பெ.14, பேராதனை
Department of National Botanic Gardens, P.O.Box 14, Peradeniya

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

වාර්ෂික කාර්යසාධන වාර්තාව
2024

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
තැ.පෙ.14, පේරාදෙණිය

පටුන

01. පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 03

02. පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 22

03. පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 23

04. පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 29

05. පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 30

06. පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 32

07. පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 36

08. උද්භිද උද්‍යාන භාර අරමුදල - වාර්ෂික කාර්ය සාධනය 44

කාර්ය සාධන වාර්තාව 2024

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරෝගාමී ආයතනය වේ. ශාක විතැන් සංරක්ෂණය,ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු, ශාක සංරක්ෂණය පිළිබඳ විද්‍යාත්මක කටයුතු ප්‍රවර්ධනය සඳහා වන පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා හඳුන්වා දීම, උද්‍යාන අලංකරණය, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විශාල දායකත්වයක් ලබාදෙන අතර ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනය දිනාගත් ස්ථානයන් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යානයන් වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතරව මෑතකාලයේදී පිළිවෙළින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට පිහිටි මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ලෙහි පිහිටි සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුළ ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුළින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් මෙම සංරක්ෂිත ශාක අතරට ඇතුළත් ය. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස දායක වන පුරෝගාමී ආයතනය වේ.

උද්භිද විද්‍යාත්මකව ශාක වර්ගීකරණය, පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යබව තහවුරු කිරීමේ කාර්යයන් කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා පර්යේෂණ සහ සංවර්ධන අංශය විසින් මල්වගා පර්යේෂණ කටයුතු සහ විවිධ මල්වගා සංවර්ධන වැඩසටහන් සිදුකරමින් ඒ හරහා රට තුල මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධන කටයුතු සිදුකෙරේ. කෙටිකාලීන පුහුණු පාඨමාලා,එක්අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත මහජනතාව සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුළින් සිදුවන මහඟු කාර්යයකි.

1.2 . ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුළ ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය, අගය කිරීම තුළින් ශාක සම්පත ජනතාවට සමීප කරවීම.


අරමුණු

- ශ්‍රී ලංකාවේ ශාක සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය සම්බන්ධව අනාගත පරපුර දැන්වත් කිරීම.
- ශාක සම්පත් විද්‍යාත්මකව නිවැරදිව සත්‍යාපනය කිරීම තුළින් නෛතික මෙන්ම ශාක ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය සහය ලබාදීම.
- ශ්‍රී ලංකාවේ මල්වගාව කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ යටිතල පහසුකම් සැපයීම.
- තිරසර සංචාරක සංවර්ධනය හා ප්‍රවර්ධනය තුළින් දේශීය ආර්ථික සහ සමාජ සංවර්ධනයට සෘජුව දායක වීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා විතැන් සංරක්ෂණ ක්‍රමවේද සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව සහ ශාක සම්පත් හා බැඳී පවත්නා වූ විවිධ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරැදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ මල්වගා කටයුතු සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
- සුදුසු ස්ථාන වල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා පිහිටුවීම.
- අලංකරණ උද්‍යාන විද්‍යාත්මක කටයුතු ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණික වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂ ලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- අනුරාධපුර ජය ශ්‍රී මහබෝධීන් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලයේ සංවිධාන සැලැස්ම



1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සහ ඒකක

- **පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය. - පේරාදෙණිය**

1821 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් ස්ථාපිත කරන ලද පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගැටඹේ ග්‍රාම නිළධාරී වසමේ පිහිටා ඇත.

හෙක්ටයාර 61.25 ක වපසරියකින් යුත් මෙම උද්‍යානය තුන් පැත්තකින් මහවැලි නදියෙන් වටවී ඇති අතර පිවිසුම් දොරටුව කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇත. තවද මුහුදු මට්ටමේ සිට අඩි 1600 ක උසින් පිහිටි මෙම රාජකීය උද්භිද උද්‍යානය අශ්ව ලාඩමක හැඩයක් ගනී. මෙම උද්‍යානය ශාක පිළිබඳ අධ්‍යයනයන්ට, උද්භිද හා පරිසර විද්‍යාත්මක පර්යේෂණයන්ට, ආර්ථික හා ඖෂධීය වටිනාකමකින් හා ඓතිහාසික වටිනාකමක් ඇති බාහිර පරිසරයෙන් වඳවී ගොස් ඇති හා තර්ජනයට ලක් වී ඇති ශාක ප්‍රදර්ශනයට මෙන්ම මහජනතාවට විනොදාස්වාදය ලබාදීමටද දායක වන ස්ථානයක් වේ. බ්‍රිතාන්‍යන් විසින් ස්ථාපිත කරන ලද පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය ශ්‍රී ලංකාව තුල ආරම්භ කරන ලද ප්‍රථම උද්භිද උද්‍යානය වන අතර මෙය ආරම්භ කිරීමට පුරෝගාමී වූයේ ඇලෙක්සැන්ඩර් මූන් මහතාය.
විශේෂයෙන්ම පෞරාණික හා අධ්‍යාපනික වටිනාකමකින් සමන්විත මෙම උද්‍යානයේ ආකර්ෂණීය විසිතුරු උඩවැඩියා ගෘහයකින් සමන්විත අතර ඇන්තූරියම්, ජර්බරා, රෝස ආදී මල් වගාවන් මෙන්ම ඖෂධීය වටිනාකමකින් යුත් ශාක වර්ග ද වෙනත් සුවිශේෂී වූ ශාක වර්ග ගණනාවකින්ද යුක්ත වේ. දුටුවන්ගේ නෙත් සිත් පැහැරගන්නා ආකර්ෂණීය උද්‍යාන සැලසුම්කරණයක ඇති සුවිශේෂිතාවයන් රාජකීය උද්භීද උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ට දැකගත හැකිවන අතර පුෂ්ප උයන්, ජපන් උයන්, වන උයන්, නැරඹීමේ අවස්ථාව ද ඇත.
ලෝක පූජිත නායකයින්, සුවිශේෂී පුද්ගලයින් විසින් සිටුවන ලද "සිහිවටන ශාක " එකතුවකින්ද මෙම උද්‍යානය සමන්විත වන අතර එය ලෝක ඉතිහාසයේ අමරණීය සිහිවටන අතර ප්‍රමුඛස්ථානයක් ගනී. එමෙන්ම මෙම උද්‍යානය තුළ තාල වර්ගයේ ශාක 200 කට අධික සංඛ්‍යාවක් දක්නට ලැබේ. මේ අතුරින් සීෂෙල්ස් දූපත නිජබිම කර උපන් ප්‍රධාන මාර්ගයේ මීටර් 100 පමණ දුරින් ගාඩිනර් ස්මාරකය දෙපස පිහිටි දෙබිඩි පොල් ශාක දෙස් විදෙස් සංචාරකයින් අතර වඩා වැඩි අවධානයක් දිනා ගනී. ලෝකයේ බරම බීජයට උරුමකම් කියන මෙම ශාක ඇතුළු තවත් තාල වර්ගයේ ශාක, මඩු ශාක, උණ ශාක, නුග ශාක, තල් ශාක ඇතුළු ශාක විශේෂ 4000 කට අධික සංඛ්‍යාවක් මෙම උද්‍යානය තුල දැකිය හැකිය.

මීට අමතරව ප්‍රධාන වශයෙන් අපනයනය කරනු ලබන කුරුඳු, ගම්මිරිස්, කරාබු හා සාදික්කා ශාක වර්ග වලින් සමන්විත කුළු බඩු උයනද මෙම උද්‍යානයේ දක්නට ලැබෙන තවත් සුවිශේෂී ස්ථානයකි.

- **හක්ගල උද්භිද උද්‍යානය - හක්ගල**

නුවරඑළිය බදුල්ල ප්‍රධාන මාර්ගයේ නුවරඑළිය නගරයේ සිට කි.මී. 9.5 ක් පමණ දුරින් ප්‍රධාන මාර්ගයට හා හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතයට මැදිව මුහුදු මට්ටමේ සිට අඩි 5400 ක් පමණ උසින් හක්ගල උද්භිද උද්‍යානය පිහිටා ඇත. උද්‍යානයේ කොටසක් මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයටත්, කොටසක් ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයටත් මායිම්ව පිහිටා ඇති හක්ගල උද්භිද උද්‍යානය නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොරඩිපොල ග්‍රාම නිළධාරී වසමටත්, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හුලංකපොල්ල නැමති ග්‍රාම නිළධාරී වසමටත් අයත් වේ.

හෙක්ටයාර 28 ක භූමි වපසරියකින් යුත් මෙම මනරම් උද්‍යානය ක්‍රි.ව. 1861 දී මැලේරියාව මර්දනය කිරීම සඳහා භාවිතා කරන ලද quinine නැමති ඖෂධය ලබා ගැනීමේ අරමුණින් සින්කෝනා වගාව උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත කිරීම සඳහා පිහිට වූ පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට භාවිතා කරන ලදී. ඩබ්. මැක්නිකොල් මහතාගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1868 සිට 1882 දක්වා ඊ.ජේ. ත්වේට්ස් මහතා විසින් පාලනය කරන ලදී.

ඉන් අනතුරුව වර්ෂ 1882 දී විලියම් නොක් මහතා විසින් පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කරන ලද මෙම භූමි කොටස උද්භිද උද්‍යාන භූමියක් ලෙස වැඩිදියුණු කොට සංචාරකයින් සඳහා විවෘත කරන ලදී. පෞරාණික වශයෙන් අතිශය වැදගත්කමක් උසුලන මෙම උද්‍යාන භූමියේ රාවණා රජු විසින් සීතා කුමරිය සගවා තැබූ ස්ථානය ලෙසටද ජනප්‍රවාදයේ සටහන් වේ.

දෙස් විදෙස් සංචාරකයින් වැඩි වශයෙන් ඇලුම් කරන උපනිවර්තන දේශගුණයක් පවතින මෙම උද්‍යාන ප්‍රදේශයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 3 සිට 20 දක්වා පරාසයක පවතින බැවින් බොහෝ දේශීය සංචාරකයින් තම විඩාව, මහන්සිය දුරුකර ගැනීම සඳහා පැමිණෙන ප්‍රමුඛතම සංචාරක ස්ථානයක් ලෙසට නම්කල හැකිය. උද්භිද උද්‍යානයේ 2000 කට අධික ශාක විශේෂ එකතුවක් දක්නට ඇති අතර ඉන් ශාක විශේෂ 500 ක් පමණ ආවේණික හා ඒකදේශික ශාක වේ. ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දීමේදී මුල්ම බීජ තොගය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට ලැබීමෙන් අනතුරුව එම උද්‍යානයෙන් ලබාගත් බීජ දෙවනුව හක්ගල උද්භිද උද්‍යාන භූමියේ වගා කරන ලද අතර වර්තමානය වන විටත් එම තේ වගාව ඉතා සශ්‍රීකව වනෝද්‍යාන කොටසේ දක්නට ලැබේ.

ලංකාවේ ස්ථාපිත උද්‍යාන අතුරින් බොහෝ දුර්ලභ අනෙකුත් උද්‍යානවල දක්නට නොමැති හක්ගල උද්භිද උද්‍යානයට පමණක් ආවේණික වූ වනසපු, මිහිරිය සහ මහරත්මල් යන මල් විශේෂ බහුලව මෙහි දක්නට ලැබීම සුවිශේෂී වේ. එපමණක් නොව වෙනත් රටවලින් (චීනය, ඕස්ට්‍රේලියාව වැනි) හඳුන්වා දුන් ෆ්ලොරිඩා ඇතුළු ශාක විශේෂ ගණනාවක්ද මෙහි පැමිණෙන සංචාරකයින්ට දැකගත හැකිවේ.

අන් උද්‍යාන පරදන අතිශය සිසිල් දේශගුණය හමුවේ උස්තුරුවියන් මගින් ආවරණය වූ මීවන ශෘක උයන සංචාරකයින්ගේ සිත් වසඟ කරගනු ලබන උද්‍යාන අංගයකි. ලයිකන හා පාසි වර්ග බහුලව දැකිය හැකි මෙම මීවන ශෘක එකතුවේ ප්‍රමුඛ මීවන ශාක විශේෂයන් වන *sphaeropteris crinite* හා *Alsophila walkerea*

ශාකද දක්නට ඇත. එමෙන්ම සියයකට ආසන්න වූ රෝස විශේෂයන්ගෙන් සමන්විත අලංකාර රෝස උයනක්ද මෙම උද්‍යානයේ දක්නට ඇත.

දේශීය සිනමා කර්මාන්තයේ දර්ශනීය පසුතල ලබා ගැනීමටත්, වෙළඳ දැන්වීම් මංගල ඡායාරූප ලබා ගැනීමටත් මෙම උද්‍යානය වැඩි වශයෙන් භාවිතා කරනු ලබයි. තවද උද්‍යානයේ භූමි අලංකරණ ශිල්පයේ වෘත්තීය නිපුණත්වය මනාව පෙන්නුම් කරමින් විශිෂ්ඨ ලෙස නිර්මාණය කර ඇති මෙම උද්‍යානය ලංකාවේ ආරම්භ කරන ලද දෙවන උද්භිද උද්‍යානයයි.

- **ගම්පහ උද්භිද උද්‍යානය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අස්ගිරිය බටහිර ග්‍රම නිලධාරී කොට්ඨාශයේ, නෙරත්ගොඩ ගම්පහ උද්භිද උද්‍යානය පිහිටා ඇත. හෙක්ටයාර 17.4 ක භූමි වපසරියකින් යුත් මෙම උද්‍යානය 1876 වර්ෂයේදී ලංකාවේ ස්ථාපිත කරන ලද තෙවන උද්භිද උද්‍යානයයි. ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන යුගයේදී බ්‍රිතාන්‍ය යේ කාර්මික අවශ්‍යතා සඳහා ස්වභාවික රබර් මහා පරිමාණයෙන් අවශ්‍ය විය. එහිදී එවකට ප්‍රධානම රබර් නිෂ්පාදකයා වූ බ්‍රසීලයෙන් රබර් ආනයනය කිරීම විවිධ ගැටළු සහගත වූ බැවින් ඉන් පරිභාහිර රටකින් රබර් ශාක වැවීමේ හැකියාව විමර්ශනය කිරීමට අවශ්‍යව තිබිණි. එහිදී බ්‍රිතාන්‍යයේ ඇමසන් කලාපයේ දේශගුණික තත්ත්වයන් හා සමානතාවක් දක්වන රටක් තෝරා ගැනීමේදී ශ්‍රී ලංකාවේ ගම්පහ හෙනරත්ගොඩ කලාපය ඒ සඳහා සුදුසු හා දේශගුණික තත්ත්වයන් සමපාත වන බැවින් රබර් වැවීම සඳහා යෝග්‍ය වන බව තීරණය කරන ලදී. එම අරමුණ පෙරදැරිකරගෙන එවකට බ්‍රසීලයේ සිටි බ්‍රිතාන්‍ය ජාතික ශ්‍රීමත් හෙන්රි විකම් මහතා විසින් ලබාදුන් නීරෝගී රබර් බීජ 70,000 කින් තෝරා ගන්නා ලද හොඳම ගුණාත්මක තත්ත්වයේ පැල 1919 ක් මෙම භූමියේ 1876 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. එම ආරම්භ කරන ලද රබර් වගාව දකුණු ආසියාවේම පළමු සාර්ථක රබර් වගාව ලෙස ප්‍රසිද්ධියක් උසුලයි. එහෙයින් වසර ගණනාවකට පසු එයින් ලබාගන්නා ලද බීජ හා පැල ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ විවිධ ස්ථාන හා දකුණු දිග ආසියාවේ රටවල් කිහිපයකට අපනයනය කරන ලදී. එනිසාම මේ දක්වා "ආසියාවේ රබර් තොටිල්ල" යන අන්වර්ථ නාමයෙන්ද ගම්පහ උද්භිද උද්‍යානය හඳුන්වනු ලබයි.

දේශීය භාවිතා කරනු ලබන ශාක විශේෂ 1000 කට අධික සංඛ්‍යාවකින් සමන්විත මෙම උද්‍යානයේ අතිශය දුර්ලභ හා පෞරාණික වටිනාකමකින් යුත් ශාක විශේෂයන්ද දැකගත හැකිය. තවද විසිතුරු උඩවැඩියා ගෘහයක්, ශාක සංරක්ෂණාගාරයක්ද මෙහි පැමිණෙන සංචාරකයින් සඳහා දැකගත හැකිවන අතර ඒ තුළින් දැනට සංරක්ෂිත ශාක සහ වඳවී යන ශාක පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවනු ඇත.
දුටුවන් නෙත් සිත් වශී කරවන භූමි අලංකරණ ක්‍රමවේදයක් උපයෝගී කර ගනිමින් නිර්මිත මෙම උද්භිද උද්‍යානය සුවිශේෂිතා රැසකට උරුමකම් කියයි. ඒ අතර මහජනතාවගේ විනෝදාස්වාදය මූලික කරගත් මෙම උද්‍යානයට පැමිණෙන දෙස් විදෙස් සියළු සංචාරකයින්හට හංස බෝට්ටු මතින් වැව් සංචාරයක අත්දැකීම් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

"තුරු මත ඉදිකළ ගෘහය " (Tree Hut) මගින් සංචාරකයින් සඳහා අලුත් අත්දැකීමකට අවස්ථාව සලසා ඇත. තවද උද්‍යානයට පැමිණෙන කුඩා දරුවන් සඳහා විනෝදාස්වාදය ලබාදීමේ අරමුණින් ළමා උද්‍යානයක් ද මෙම උද්‍යාන භූමියේ ස්ථාපිත කර ඇත.

- **මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහළ බැරගම සහ මානජ්ජාව ග්‍රාම සේවා වසම තුළ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය පිහිටා ඇත. මුහුදු සීමාවේ සිට කි.මී. 05 ක් පමණ ගොඩබිමට වන්නට දකුණු දෙසින් කොළඹ කතරගම ප්‍රධාන මාර්ගයට යාබදවත් නැගෙනහිරින් මිරිජ්ජවිල සූරියවැව ප්‍රධාන මාර්ගයට යාබදවත් මෙම උද්‍යානය පිහිටා ඇත.

දේශීය විශේෂඥයින් විසින් නිර්මිත ලංකාවේ පළමු උද්භිද උද්‍යානය මෙය වේ. ලඳුකැලෑ සහිත වනාන්තරයකින් වැසී පැවති මෙම භූමිය දිගු කාලයක් තිස්සේ මානව හා භෞතික බලපෑම් හේතුවෙන් විවිධ තර්ජනයන්ට ලක්වූ ස්ථානයකි. සමහර භූමි කොටස් ගොවීන් විසින් හේන් හා කුඹුරු ගොවිතැන සඳහා යොදා ගෙන තිබුණි. 2006 වර්ෂයේදී වියළි කලාපයට ආවේණික වූ ශාක විතැන් සංරක්ෂණය කිරීමේ අරමුණින් උද්භිද උද්‍යානයක් ලෙස භාවිතා කිරීමට ඇති සක්‍යතාවය පිළිබඳ සොයා බලන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම භූමිය උද්භිද උද්‍යානයක් බවට සංවර්ධනය කොට 2013 වර්ෂයේ නොවැම්බර් 13 වන දින හෙක්ටයාර 120.4 කින් යුතු මෙම භූමිය පොදු රාජ්‍ය මණ්ඩලීය නායක විශේෂ සමුළුවට සමගාමීව මහජනතාව සඳහා විවෘත කරන ලදී.

ලංකාවේ උද්භිද උද්‍යාන හා සසඳන කල්හි භූමි වපසරියෙන් ඉතා විශාලතම උද්භිද උද්‍යානය මෙය වන අතර මෙහි සුවිශේෂිතා රාශියක් දැකගත හැකි වනු ඇත. එහිදී මීටර් 160 ක දිගින් යුතු "විලෝ මාවත " ඒ අතර සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. ආසියාවේ දිගම විලෝ මාවත පිහිටි උද්භිද උද්‍යානය මෙය වේ. එම මාවතත් සමග ප්‍රධාන මං මාවත් 26 කින් සමන්විත මෙම උද්භිද උද්‍යානයේ එම සෑම මාවතක්ම සුවිශේෂී වූ දේශීය මෙන්ම විදේශීය ශාක එකතුවකින් නිර්මාණය කර ඇත.

තවද වියළි කලාපයට පමණක් ආවේණික වූ ශාක විශේෂ 105 කට අයත් ශාක 2000 කට අධික ප්‍රමාණයක් රෝපණය කර ඇති මිශ්‍ර වන උද්‍යානයකින් සමන්විත මෙහි ඒ ඒ ශාක තුලකයන්ට අයත් ඒ ඒ ශාක වර්ග හඳුනාගත හැකිවන පරිදි නාමකරණයකින් යුතු විධිමත් වන උද්‍යානයකින්ද සමන්විත වේ.
තවද වියළි දේශගුණික තත්ත්වයන් යටතේ වැවෙන ඖෂධීය ශාක විශේෂ 250 කට අයත් ශාක 460 කට වඩා අධික සංඛ්‍යාවක් ද මෙහි පැමිණෙන සංචාරකයින්ට දැකගත හැකිවනු ඇත.

තවද පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයින්ගේ සමුළුව නිජෝජනය කිරීම සඳහා මෙරටට පැමිණි නායකයින් 52 දෙදෙනෙකු විසින් රෝපණය කරන ලද සිහිවටන ශාක එකතුව ද මෙම උද්‍යානයේ දක්නට ලැබෙන සුවිශේෂී අංගයකි. තවද දකුණු පළාතට ආවේණික හා වෙනත් ප්‍රදේශවලට ආවේණික පතොක් හා මාංශලමය ශාක රාශියකින් සමන්විත කාන්තාර ආකෘතියක් මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කර ඇත. මේ හා සමගම ප්‍රංශයේ වර්සෙල්ස් උද්‍යානයේ අනුරුවක් පාදක කර ගනිමින් නිර්මාණය කර ඇති විධිමත් උයන ද මහජනතාවට දැකබලා ගත හැකිවනු ඇත.
සංචාරක ආකර්ෂණය ලබා ගැනීම සඳහා විවිධ හැඩතල සහ අංග උපයෝගී කර ගනිමින් සකස් කර ඇති ටොපියරි උද්‍යානයක් විවිධ මල් වර්ග සහ පඳුරු වර්ග වලින් නිර්මාණය කර ඇති විසිතුරු පඳුරු උයනත් මෙම උද්‍යානයේ ඇති සුන්දරත්වය සහ අලංකාරත්වය තව තවත් වැඩිදියුණු කරයි

සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයට අයත් සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉළුක්ඕවිට ග්‍රාම නිළධාරී වසමේ සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය පිහිටා ඇත. හෙක්ටයාර 42 ක භූමි වපසරියක පිහිටා ඇති මෙම උද්‍යානය වර්ෂ 2008 දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වර්ෂ 2015 දී මහජනතාව සඳහා විවෘත කරන ලදී. තෙත් කලාපයට ආවේණික වූ ශාක විතැන් සංරක්ෂණය කිරීමේ අරමුණින් මෙම භූමිය උද්භිද උද්‍යානයක් බවට සංවර්ධනය කරන ලදී.

දර්ශනීය කඳු පන්තියකට මායිම්ව මනරම්ව ඉදිකරන ලද මෙම සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය දැකුම්කළු උද්‍යාන නිර්මාණයකින්කින් යුක්ත වේ. එක් පසෙකින් ඇති වැව් කොටස, උද්‍යානයේ ශාක පද්ධතියට ජීවය සපයන ප්‍රධාන ජල මූලාශ්‍රයන් අතරට එක්වන අතරම උද්‍යානයට පැමිණෙන මහජනතාවට බෝට්ටු සංචාරය කිරීමෙන් විනෝදයක් ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

උද්‍යානයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා ඉතා සෞම්‍ය දේශගුණයක් සහිත මෙම උද්‍යානය තුල කුඹුක් කොටස මතින් උද්‍යානයේ සිරි නරඹන විට අමුතුම අත්දැකීමක් ලබා ගැනීමට හැකිවනු ඇත. තවද උද්‍යානයේ ඉහළ කොටසට වන්නට ඉදිකර ඇති නැරඹුම් වේදිකාව මගින් උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ට උද්‍යානයේ දර්ශනීය ස්ථාන, අවට පරිසරය, මෙන්ම ඈතින් දිස්වන සොඳුරු දසුන් දැක බලා ගැනීමට ද අවස්ථාව ලැබෙනු ඇත.

උද්‍යානයේ භූමි වපසරිය පුළුල් පරාසයක පවතින බැවින් උද්‍යානය විඩාවකින් තොරව ගමන් කිරීම සඳහා ගෝල්ෆ් කාර් රථ සේවා යොදා ඇති අතර තෙත් කලාපයට ආවේනික පක්ෂීන් දැකබලා ගැනීමට එම සංචාරය අතරතුර අවස්ථාව ලැබෙනු ඇත.
තවද රෝස උයන, ජපන් උයන, මීවන උයන,වන උයන, පළතුරු ශාක එකතුවකින් මෙන්ම තාල ශාක එකතුවකින්ද උද්‍යානය හැඩවන අතර උද්‍යානයට ආවේණික ශාක විශේෂ ගණනාවක්ද උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ට දැකබලා ගත හැකිය.

දේශීය සිනමා කර්මාන්තයේ දර්ශනීය පසුතල ලබා ගැනීමටත්, වෙළඳ දැන්වීම් මංගල ඡායාරූප ලබා ගැනීමටත් මෙම උද්‍යානය ප්‍රසිද්ධියක් උසුලයි.. තවද උද්‍යානයේ භූමි අලංකරණ ශිල්පයේ වෘත්තීය නිපුණත්වය මනාව පෙන්නුම් කරමින් විශිෂ්ඨ ලෙස නිර්මාණය කර ඇති මෙම උද්‍යානය ලංකාවේ ආරම්භ කරන ලද පස්වැනි උද්භිද උද්‍යානයයි.

- **ගනේවත්ත වන ඖෂධ උද්‍යානය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පන්නව ග්‍රාම නිළධාරී වසමේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. හෙක්ටයාර 21 ක භූමි භාගයක පිහිටි මෙම උද්‍යානයේ ඉතිහාසය වර්ෂ 1955 දක්වා දිවයයි. අතීතයේ දුම්කොළ වියළන මධ්‍යස්ථානයක්ව පැවති මෙම ස්ථානය 1955 වර්ෂයේදී ඖෂධ පැල විතැන් සංරක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාම ආරම්භ කරන ලදී.

වඳවී යෑමේ තර්ජනයට ලක්වී ඇති ශාක විශේෂ 1000 කට අධික සංඛ්‍යාවක් මෙම වන ඖෂධ උද්‍යානය තුළ විතැන් සංරක්ෂණය කර ඇති අතර දුර්ලභ ඖෂධ ශාක විශේෂ ගණනාවක්ද මෙම උද්‍යානයේ දැකගත හැකිය. ඖෂධීය ශාක විශේෂ වැඩි පමණක් ඇති ලංකාවේ එකම උද්‍යානය මෙය වන අතර මීට අමතරව අතරමැදි කලාපයට ආවේණික ශාක විශේෂයන්ද මෙහි දැකගත හැකිය.

මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය, පේරාදෙණිය

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන අංශය, මල්වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කැපවී සිටී.
ශ්‍රී ලංකාවේ මල් වගාකරුවන් දිරිමත් හා සවිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍රයේ උපදේශන සේවා හා ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු, උපකරණ සහ තත්ත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා මෙම ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

සහකාර අධ්‍යක්ෂ කාර්යාලය , නාරාහේන්පිට.

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි මල්වගා කරුවන්ගේ ‘‘සුවහස් මල්’’ සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැලසීම නාරාහේන්පිට පිහිටි ’’සුවහස්මල් ’’ඒකකයෙන් සිදු කරනු ලබයි.
අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස බද උද්‍යාන
අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුර පිහිටි නිල නිවාස උද්‍යානයන් සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිලනිවාසබද උද්‍යානයන්හි නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශවල පවත්වා ගෙන යන අතර දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි.

හරිත පියස පුහුණු මධ්‍යස්ථානය, මීගලෑව

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය දැනට සංවර්ධනය වෙමින් පවතී. මල් වගාව පිළිබඳව පාඨමාලා පවත්වාගෙන යන අතර ශාක ප්‍රචාරණය සිදුකරන මධ්‍යස්ථානයක් ලෙස ද කටයුතු කරනු ඇත.

ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක්රැස් කර ඇති ස්ථානයකි. වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක 179,000 ආසන්න ප්‍රමාණයක් යෝග්‍ය තත්ත්වයන් යටතේ ක්‍රමානුකූල අධ්‍යයනය සහ විමර්ශන කාර්යයන් සඳහා සංරක්ෂණය කරමින් තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේ තැන්පත් කර ඇත. ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක, ශාක වර්ගීකරණ පර්යේෂණ සඳහා මෙන්ම ජෛව විවිධත්ව අධ්‍යයන කටයුතු සඳහා දත්ත බැංකුවක් ලෙසද ශාක හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා යොදා ගනී.

1.6 මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය - 2024

රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

- උද්‍යානවල විකාශනය, උද්‍යාන පිළිබඳ ඉතිහාසය හා උරුමය පිළිඹිඹු කිරීමේ අරමුණින් ස්ථාපිත කරන ලද කෞතුකාගාරයේ එළිමහන් ප්‍රදේශ සංවර්ධන කටයුතු මෙම වර්ෂය තුලදී නිම කරන ලදී.
- පසුගිය වසරේ ආරම්භ කරන ලද උද්‍යානයේ ශාක නඩත්තු කටයුතු සඳහා ජල සැපයුම් ලබාගැනීමේ අරමුණින් මා ඔය හරහා ජලය ලබා ගැනීමේ ව්‍යාපෘතියේ මූලික වැඩකටයුතු මෙම වර්ෂය තුලදී සාර්ථකව නිම කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සමරු තිළිණ ලබාගන්නා ලක්සල ගොඩනැගිල්ලෙහි වහලයේ අළුත්වැඩියා කිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර එහි සියළු අළුත්වැඩියාවන් මේ වන විට අවසන් කර ඇත.
- උද්‍යානයේ ජීවය වන පැල තවානෙහි ස්ථාපිත කරන ලද ශාක ගෘහවල අලුත්වැඩියා කිරීම් කටයුතු සිදුකරන ලද අතර සෙවණ ගෘහවලද අලුත්වැඩියා කිරීම් කටයුතු ද සිදු කරන ලදී.
- උද්‍යානයට අවශ්‍ය රාක්ක, පුටු මේස ආදී ලී ආශ්‍රිත නිර්මාණ සිදු කරනු ලබන වඩු මඩුවෙහි අළුත්වැඩියා කිරීම් කටයුතු සිදු කරන ලද අතර එයට අවශ්‍ය උපකරණ ද මිලදී ගන්නා ලදී.
- තවද උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ගේ වැඩි ආකර්ෂණයක් ලබා ගැනීම සඳහා ශාක සංරක්ෂණාගාරයේ නඩත්තු කටයුතු සිදු කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලද අතර උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ට නැරඹීමට ඉදිකර ඇති දෙස් විදෙස් ශාක ඇතුලත් ශාක ප්‍රචාරණ ගෘහයේ අලුත්වැඩියා කිරීම් කටයුතු සිදු කරන ලද අතර ඒ මගින් විධිමත්ව, ආරක්ෂිතව, හා සෞඛ්‍ය සම්පන්නව ශාක ප්‍රචාරණ කටයුතු සිදු කර ගැනීම මූලික අරමුණ වේ.
- විනෝදාස්වාදය ලබාගැනීමට හා මහන්සිය, විඩාව දුරුකරගැනීමටත් රාජකාරී කටයුතු සඳහාත් පැමිණෙන රාජ්‍ය නිළධාරීන්ට නවාතැන් පහසුකම ලබාදීම මූලික අරමුණු කර ගනිමින් ඉදිකරන ලද රාජකීය උද්භිද උද්‍යානයේ ගින්නෙන් අලාභ හානි වූ සංචාරක නිවාසය මේ වන විට සියළු අළුත්වැඩියා කටයුතු නිම කොට තීන්ත ආලේපනය කර නිලධාරීන්ට පහසුකම් ලබා ගැනීම සඳහා විවෘත කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ට ඉතා පහසුවෙන් හා ආරක්ෂිතව ගමන් කිරීම සඳහා මීවන කොටසේ එම ප්‍රදේශයේ අතුරු අඩි පාරවල්, මංමාවත් සියල්ල විධිමත්ව සංවර්ධනය කරන ලදී.

- රාජකීය උද්භිද උද්‍යානයේ වනෝද්‍යාන ශාක කොටසේ සහ පිටත එළිමහන් ශාක කොටසේ ඇති කාර්යාල පරිශ්‍රයන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන සිවිලිම් අලුත්වැඩියා කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 95,388 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය - ගම්පහ

- උද්භිද උද්‍යානයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම වසරේදී ද සංවර්ධන වැඩසටහන් සිදු කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ගේ පහසුකම් තව දුරටත් ඉහළ නැංවීමටත් උද්‍යාන නව ප්‍රවේශ මාර්ගය සඳහා ස්ථාපිත ආරක්ෂිත ගේට්ටුවෙහි ඉදිකිරීම් කටයුතු නිම කරන ලදී.



අළුත්වැඩියා කරන ලද පැල ගෘහයේ වහලය

- උද්‍යානයේ රෝපිත පැළ සඳහා සඳහා අවශ්‍ය ජල සැපයුම් ලබා ගැනීමටත්, උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහාත් ඉදිකරන ලද ජල ටැංකියෙහි සංවර්ධන කටයුතු මෙම වසරේදී නිම කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන සංචාරකයින්ගේ පහසුකම් තව දුරටත් ඉහළ නැංවීමටත් උද්‍යානයේ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම උදෙසාත් ආරම්භ කරන ලද නව වැසිකිළි පද්ධතියෙහි ඉදිකිරීම් කටයුතු මෙම වර්ෂය තුලදී නිම කරන ලදී.



නව ප්‍රවේශ මාර්ගයේ ස්ථාපිත ගේට්ටුව

- තත්ත්වයෙන් උසස් ශාක එකතූන් නිෂ්පාදනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පැළ තවාන් ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 23,986 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

හක්ගල උද්භිද උද්‍යානය

- උද්‍යානයේ වැඩ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නව උද්‍යාන උපකරණ මිලදී ගැනීම් කටයුතුද සිදු කරන ලද අතර උද්‍යානයේ තත්ත්වය හා ආකර්ෂණය වැඩිදියුණු කිරීම සඳහා ගිම්හාන කුටි තීන්ත ආලේප කිරීම්, ගොඩනැගිලි සහ නිල නිවාස තීන්ත ආලේප කිරීම් ආදී ක්‍රියාකාරකම් රාශියක් මෙම වසර තුලදී සිදු කරන ලදී.



නවීකරණය කරන ලද ගිම්හාන කුටි

- උද්‍යානය නැරඹීම සඳහා පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ඉදිකරන ලද නව වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇත.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 176,332 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.



නව වැසිකිළි පද්ධතිය

ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍ය ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් නගා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.



මල්වගා ප්‍රදර්ශන කුටියක්

- දිවයින පුරා දැනට මල්වගා ව්‍යාප්තිය සඳහා ක්‍රියාත්මක වන මල්වගා සංගම් ප්‍රමාණය 216 ක් වන අතර ඒ හරහා සාමාජිකයින් විශාල ප්‍රමාණයක් ප්‍රතිලාභ ලබයි. මල්වගා අංශය මගින් ක්‍රියාත්මක කරන ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බරා,කැපූ පත්‍ර වගාවන් සහ පටක රෝපණය ආදී එක් දින මල්වගා පුහුණු පාඨමාලා හරහා පුද්ගලයින් දෙනෙකු පුහුණු කර ඇත.

- මල්වගා සංවර්ධන හා පර්යේෂණ ඒකකය මගින් ඕකිඩ්, ඇන්තූරියම්, විසිතුරු පත්‍රික ශාක 200,151 කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.
- මල්වගා කරුවන්ගේ මල්පැළ සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ මට්ටමේ ප්‍රදර්ශන 141 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ මහා පරිමාණ ප්‍රදර්ශන 16 ක් පවත්වන ලදී. මල්වගා කරුවන්ගේ පැළ තවාන් 819 කට ගොස් ඔවුන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබා දෙන ලදී.



පැවැත්වූ මල්වගා ප්‍රදර්ශනවල එක් අවස්ථාවක්

- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගාකරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ 17ක් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව වාණිජමය මල්වගාව, තවාන් පාලනය, වගාවන් සම්බන්ධ පලිබෝධ සහ රෝග කළමණාකරනය ආශ්‍රිතව පැන නගින ගැටළු සම්බන්ධව පුද්ගලයින් සහ ආයතන සඳහා අය කිරීමකින් තොරව උපදේශන කටයුතු සිදු කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කෘෂිකර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව එක්ව සංවිධානය කරන ලද මල් වගා පර්යේෂණ පිළිබඳ වාර්ෂික ජාතික සම්මන්ත්‍රණය (NaSFLOR-2024), 2024 දෙසැම්බර් 06 වැනි දින පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යාන පරිශ්‍රයේ දී පවත්වන ලදී. මල් වගා ක්ෂේත්‍රයට අදාලව නවතම හා කාලීන පර්යේෂණ සොයාගැනීම් එළිදැක්වීම සහ සාකච්ඡා කිරීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණ විය මාර්ගගත ක්‍රමය ඔස්සේද සහභාගීත්වය ඇතිව දෙමුහුන් ඉසව්වක් ලෙස පැවැත්වූ NASFLOR-2024 *"Booming Future: Sustainable Innovations for Export-Oriented Floriculture"* යන තේමාව කේන්ද්‍ර කරගනිමින් මල් වගා අංශයේ නවතම ප්‍රගතිය කෙරෙහි අවධානය යොමු කරමින් කර්මාන්තයේ තිරසාරත්වය සහ වර්ධනය පෝෂණය කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන් සහ ප්‍රායෝගික විසඳුම් ඉස්මතු කරන ලදී. ශාක ප්‍රචාරණය, පටක රෝපණ ශිල්පීය ක්‍රම සහ සංරක්ෂණය, විසිතුරු ශාකවල වර්ධනය, වාණිජමය වටිනාකම සහ ශක්‍යතාව සහ මල් වගා නිෂ්පාදන සඳහා පසු අස්වනු තාක්ෂණය හා අගය එකතු කිරීමේ ක්‍රමවේද යටතේ පර්යේෂණ පත්‍රිකා 17ක් ඉදිරිපත් කරන ලදී. පර්යේෂකයන්, වෘත්තිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පාර්ශ්වකරුවන් ඇතුළු 180 ක පමණ සහභාගීත්වයෙන් පැවති NASFLOR-2024 වැඩසටහන, තිරසාර හා ශක්තිමත් මල් වගා කර්මාන්තයකට අනාගත මාර්ගය සැලසුම් කිරීමට, දැනුම ප්‍රවර්ධනය කිරීමට, පර්යේෂකයන් වෘත්තිකයන් හා ඒ ආශ්‍රිත නිෂපාදකයින් අතර සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා දායක වූ වැදගත් සංදිස්ථානයක් ලෙස හැඳින්විය හැක.

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි මල්වගා අංශයෙහි ස්ථාපිත ඇන්තූරියම් ගෘහයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද අතර එහි වැඩකටයුතු 2024 වර්ෂයේදී නිමකරන ලදී.

අධ්‍යාපනය සහ පුහුණුව

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන මධ්‍යස්ථානයේ නඩත්තු කිරීම් කටයුතු මේ වසරේදී ද සිදු කරන ලදී.
- තරුණයින් 94 දෙනෙකු නවීන මල් වගා ක්‍රමවේද, භූඅලංකරණ ක්‍රමවේද පිළිබඳව සිව්මාසික පාඨමාලාව හරහා පුහුණු කරන ලද අතර එම සියලු දෙනාටම සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී.



පුහුණු වැඩමුළු පවත්වන අවස්ථාවක්

- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 5 (NVQ-level 5) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 10 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරන ලදී.
- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 09 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරන ලදී.



පුහුණු වැඩමුළු පවත්වන අවස්ථාවක්

- රෝස වගාව,තවාන් කළමනාකරණය, ශාක හදුනාගැනීම, ශාක ප්‍රතිකාර කිරීම්, මල් සැකසුම්,පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 3,073 ක් පුහුණු කරන ලදී.
- රැකියාගත පුහුණු වැඩසටහන් හරහා පුද්ගලයින් 151 ක් දෙනෙකු පුහුණු කරන ලදී.

සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය - අවිස්සාවේල්ල

- උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් උද්‍යානය තුළ ඇති කිරීම, නඩත්තු කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සහ උද්‍යානය තුළ නව පහසුකම් ඇති කිරීම සඳහා විවිධ සංවර්ධන කටයුතු මේ වසරේදී සිදු කරන ලදී.
- උද්‍යානය කරා පැමිණෙන සංචාරකයින්ගේ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් උද්‍යානයේ කුඹුක කොටසෙහි මාර්ග අළුත්වැඩියා කිරීම් සිදුකරන ලදී.

- උද්‍යානයේ ඇන්තූරියම් මල්වගා ගෘහයේ පාරජම්බුල කිරණ වලින් සිදුවන බලපෑම් අවම කර ගැනීම සඳහා පොලිතීන් (UV treated) ආවරණ සවි කරන ලදී.
- තවද උද්‍යානයට පැමිණෙන නරඹන්නන්හට උද්‍යානය තුල ඇති ශාක වර්ග, උද්‍යානයේ පිහිටීම වැනි වැදගත් තොරතුරු දැන ගැනීම සඳහා උද්‍යාන පරිශ්‍රය තුළ ශාක නාම ප්‍රදර්ශන පුවරු සහ සිතියම් ප්‍රදර්ශනය කිරීම් කටයුතුද සිදුකරන ලදී.



අළුතින් ඉදිකරන ලද නාම පුවරු

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 40,515 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩිදියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, පාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සිදු කරන ලදී.
- උද්‍යානයට පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙන්ම උද්‍යානයේ අලංකාරත්වය තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානය වටා ඇති මායිම් වැටෙහි අළුත්වැඩියා කිරීම් කටයුතු, ගොඩනැගිලි අළුත්වැඩියා සහ තීන්ත ආලේපනය කිරීම් කටයුතු සිදුකරන ලද අතර ප්‍රවේශපත්‍ර කවුළුවෙහි, ප්‍රධාන ගේට්ටුවෙහි හා සෙසු සියළු සුළු අළුත්වැඩියා කිරීම් කටයුතු ද සිදු කරන ලදී.
- උද්‍යානයට බාහිරින් පැමිණෙන සත්ව උවදුරින් ආරක්ෂා වීම සඳහා ඉදිකරන ලද මායිම් වේන්ලින්ක් වැටෙහි සංවර්ධන කටයුතු නිම කරන ලදී.
- උද්‍යානයේ මල්වගා අංශයේ ඉදිකර ඇති පැල ගෘහයෙහි අලුත්වැඩියා කිරීම් කටයුතු මෙන්ම උඩවැඩියා ගෘහයේ අළුත්වැඩියා කිරීම් කටයුතු සිදුකළ අතර ඒ තුලින් සංචාරකයින් සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් හා ප්‍රමිතියකින් යුතු පැල ගෘහයන් දැකබලා ගැනීමේ අවස්ථාව හිමිවනු ඇත.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව වැඩිදියුණු කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැල නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 31,612 ක පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

ගනේවත්ත වන ඖෂධ උද්‍යානය



අළුත්වැඩියා කරන ලද පැල ගෘහයේ වහලය

- උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදුකිරීම තුළින් උද්‍යානය උසස් තත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.
- උද්‍යානයෙහි ආරක්ෂාව සඳහා ඉදිකරන ලද චේන් ලින්ක් වැටෙහි අලුත්වැඩියාකිරීම් කටයුතු සිදුකරන ලද අතර ඒ මගින් උද්‍යානයට බාහිරින් පැමිණෙන වන සතුන්ගෙන් සිදුවන හානි අවම කර ගැනීමත්, උද්‍යානයේ ආරක්ෂාව තර කිරීමත් මූලික අරමුණ වේ.
- උද්‍යානයේ පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 34,047 කට අධික ප්‍රමාණයක් නිපදවන ලද අතර ශාක එකතූන් අලුතින් ඇතිකිරීමේ කටයුතු ඇතුළුව ශාක එකතූන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.



අළුතින් ඉදිකරන ලද චේන් ලින්ක් වැට

- ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 659 දෙනෙකු ඖෂධශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශණ පවත්වා දැනුවත් කරන ලදී.
- දැදුරු ඔයෙන් උද්‍යානය වෙත ජලය ලබා ගැනීමේ ව්‍යාපෘතිය හරහා උද්‍යානයට ජලය ලබා ගැනීම සඳහා අවශ්‍ය විදුලි පහසුකම් ලබා ගැනීම සඳහා මූලික පියවර ලෙස විදුලිබල මණ්ඩලය සමග සාකච්ඡා කරන ලදී.

මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය



සංවර්ධනය කරමින් පවතින වගා ළිඳ

- ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කරන ලද අතර ඒ තුළින් පැළ නඩත්තු කිරීම්, උද්‍යානය නඩත්තු කිරීම් කටයුතු සිදු කරන ලදී.
- මෙම වසරේදී ද පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර අගය එකතු කරන නිෂ්පාදන සහ ශාක එකතූන් වැඩිදියුණු කිරීම් කටයුතු ද සිදුකරන ලදී.
- විවිධ වගාවන් පුහුණු මධ්‍යස්ථාන වගා භූමියේ ස්ථාපිත කරන ලද අතර දෛනිකව සිදු කරනු ලබන සෙසු සියළු අළුත්වැඩියා කටයුතු, සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.

- උද්‍යානය සතු පැළ මනාව නඩත්තු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රධානම පහසුකම් වන ජල පහසුකම් ලබා ගැනීමට උද්‍යානයේ වගා ළිඳක් ස්ථාපිත කළ අතර එහි ඉදිකිරීම් කටයුතු සියල්ල මෙම වර්ෂය තුලදී සාර්ථකව නිම කරන ලදී.

- තවද කාර්ය මණ්ඩලයේ සේවා තෘප්තිය වැඩිදියුණු කර ගැනීමටත් උද්‍යානගත වාහන හා උපකරණ රැඳවීම සඳහාත් උද්‍යානයේ රථවාහන නැවතුම් අංගනයක් ඉදිකරන ලද අතර එහි වැඩකටයුතු මේ වන විට අවසන් කර ඇත.

- උද්‍යානයේ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 7,290 කට අධික ප්‍රමාණයක් නිපදවන ලද අතර ශාක එකතූන් අලුතින් ඇතිකිරීමේ කටයුතු ඇතුළුව ශාක එකතූන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.

- පුහුණු කටයුතු සඳහා පැමිණෙන පුහුණුලාභීන්ට පහසුකම් වර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද ක්ෂේත්‍ර නිවහනේ වහලයෙහි අළුත්වැඩියා කිරීම් කටයුතු නිම කරන ලදී.

ඉහත සඳහන් සංවර්ධන වැඩසටහන් වලට අමතරව දෙපාර්තමේන්තුව විසින් මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක, අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01, මහනුවර, නුවරඑළිය සහ අනුරාධපුර නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ අරලියගහ මැදුර නිල නිවාස උද්‍යානය සහ නුවරඑළිය නිල නිවාස උද්‍යානය ද අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්වය මනා ලෙස පවත්වාගෙන යාමේ කටයුතු ද සිදු කරනු ලැබීය.


සියළුම උද්‍යානයන්හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුලින් ද නව සංවර්ධිත ප්‍රදේශ, පාරවල්, වීදි, උද්‍යානයේ විවිධ අංශ කාර්යක්ෂමව නඩත්තු කිරීම තුලින් ද උද්‍යානයන් හි අලංකරණය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

1.7. නරඹන්නන්ගේ පැමිණීම


2024 වසරේදී ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඒකක ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී.

මෙම වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුලු සංචාරකයන් සංඛ්‍යාව 2,464,535 ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 2,118,941ක් දේශීය සංචාරකයින් වන අතර 345,594 ක් විදේශීය සංචාරකයින් වේ.

1.7.1 2024 වසරේදී උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාත්මක තොරතුරු



උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරක සංඛ්‍යාවන්



2023 හා 2024 වසරවල දී උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය විදේශීය සංචාරකයින්ගේ සංසන්දනාත්මක තොරතුරු

1.7.2. 2020 වර්ෂයේ සිට 2024 වසර තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

විස්තරය	වර්ෂය				
	2020	**2021**	**2022**	**2023**	**2024**
දේශීය නරඹන්නන් සංඛ්‍යාව	642,573	714,493	1,773,048	1,925,129	2,118,941
විදේශීය නරඹන්නන් සංඛ්‍යාව	93,304	18,412	103,322	227,729	345,594
එකතුව	**735,877**	**732,845**	**1,876,370**	**2,152,858**	**2,464,535**

2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ජාතික උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගෙන් ලැබුණු මුළු ආදායම

විස්තරය		වර්ෂය			
	2020	**2021**	**2022**	**2023**	**2024**
දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි)	67.91	64.6	143.31	223.061	320.577
විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි)	181.829	35.785	200.18	568.651	1,031.706
එකතුව (රු.මි)	**249.739**	**100.385**	**343.49**	**792.326**	**1,352.283**

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

- ශ්‍රී ලංකා ඉතිහාසයේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වාර්තා කළ වැඩිම ආදායම 2024 වර්ෂයේ ලභා කර ගැනීමට හැකිවීම.
- 2023 වර්ෂයට සාපේක්ෂව විදේශීය සංචාරකයින් 120 % ප්‍රමාණයක් වැඩිකර ගැනීමට හැකිවීම.
- මල්වගා හා උද්‍යාන අලංකරණ ජාතික ඩිප්ලෝමාව NVQ 5 මට්ටම ආරම්භ කිරීම හා වෘත්තීය නිපුණතා සහතික නිකුත් කිරීමට හැකිවීම.
- මාර්ගගත ප්‍රවේශ පත්‍ර ක්‍රමයක් ස්ථාපිත කිරීමට හැකිවීම.
- ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතව *lamiaceae* ශාක කුලයට අයත් *coleus* ශාක ගණයේ නව ශාක විශේෂයක් සොයා ගැනීම.

2.2 අභියෝග

- දේශීය සහ විදේශීය වශයෙන් සිදුවන ආරක්ෂක, ආර්ථික, දේශපාලනික හා සමාජීය වශයෙන් සිදුවන බලපෑම් හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීමට සිදුවන බලපෑම.
- දේශගුණික සහ පාරිසරික සාධක වෙනස්වීම්වල බලපෑම.
- නව උද්භිද උද්‍යාන පිහිටුවීමේදී සුදුසු ඉඩම් හඳුනාගැනීම සහ පවරාගැනීමේදී ඇතිවන ගැටළු.
- අන්තර් ජාතිකව උද්භිද උද්‍යාන ප්‍රචාරණය ඉහළ නංවා ගැනීමේදී මතුවන ගැටළු.
- නවීන තාක්ෂණ අවස්ථා අත්පත් කර ගැනීමේදී තාක්ෂණ නිළධාරීන්ගේ හිහකම හේතුවෙන් මතුවන බාධා.
- දේශපාලනික ආර්ථික සහ සමාජීය ප්‍රතිපත්තිමය වශයෙන් සිදුවන බලපෑම. (බඳවාගැනීම් සීමා කිරීම නිසා)

2.3 ඉලක්ක

- සියලුම උද්භිද උද්‍යාන අන්තර්ජාතික ප්‍රමිති තත්ත්වයන්ට අනුකූලව දකුණු ආසියාතික කලාපයේ හොඳම උද්භිද උද්‍යාන බවට පත් කිරීම.
- ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳ ජාතික දත්ත පද්ධතිය වැඩිදියුණු කර පවත්වාගෙන යාම.
- ජාතික අණුක ජීව විද්‍යා රසායනාගාරය ඉදිකිරීම.
- පරිසර විද්‍යාත්මක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අදාල SDG ඉලක්ක සපුරා ගැනීම.

- ❖ නරඹන්නන් සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ ඵලදායිතා ස්වර්ණ සම්මානය දිනා ගැනීමට කටයුතු කිරීම.
- ❖ හොඳම සංචාරක මධ්‍යස්ථානයට හිමි සහතික පත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ❖ සැමට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කර ජීවිතකාලය පුරාවට අධ්‍යාපන අවස්ථා ඇතිකිරීම.
- ❖ ජෛව විවිධත්ව සංරක්ෂණ, කාන්තාරීකරණය පිටුදැකීම වෘක්ෂලතා සංරක්ෂණය මගින් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම.
- ❖ දැනට උද්භිද උද්‍යාන පිහිටුවා නැති විශේෂිත කලාපවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම.
- ❖ සුළු හා මධ්‍ය පරිමාණ මල් හා විසිතුරු පැළ ව්‍යවසායකයින් සඳහා ලබා දෙන දිරිගැන්වීම් පුළුල් කිරීම හා මල්වගා සංගම් සාමාජික සංඛ්‍යාව ඉහළ නැංවීම. හා ඔවුන්ගේ ජීවන මට්ටම ඔසවා තැබීමට දායක වීම. මල්වගා නිෂ්පාදන අපනයනයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට දායකත්වය ලබාදීමට කටයුතු කිරීම.

- ❖ ශ්‍රී ලංකාවේ දල ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමේදී සංචාරක ක්ෂේත්‍රයේ සැලකිය යුතු දායකත්වයක් උද්භිද උද්‍යානය මගින් ලබාදීම.

03.පරිච්ඡේදය- වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

03.01. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

03.02. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

03.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

03.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	2024 රු.	2023 රු.	
1,150,000,000	**ආදායම් ලැබීම්**		1,366,415,878	833,193,462	
-	ආදායම් බදු	1	41,978,025	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	1,324,437,853	833,193,462	
1,150,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		1,366,415,878	833,193,462	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		84,999,000	57,230,000	ඒසිඒ-3
-	නැන්පතු		213,899,863	111,564,644	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		31,621,779	33,706,010	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		41,978,025	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**372,498,667**	202,500,654	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**1,738,914,545**	1,035,694,116	
-	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		760,019,651	248,795,769	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		978,894,893	786,898,347	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
543,400,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	526,311,897	457,434,174	
207,150,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	164,225,435	139,025,422	ඒසිඒ-2(ii)
1,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,134,846	1,244,498	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
752,050,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**691,672,177**	597,704,094	
	මූලධන වියදම්				
30,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	22,487,849	8,858,414	
64,500,000 X	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	X 50,718,235	21,620,328	
38,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	38,323,320	50,251,047	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	499,280	493,790	
23,000,000	වෙනත් මූලධන වියදම්	15	19,728,261	32,868,196	
156,500,000	**මුළු මූලධන වියදම් (උ)**		**131,756,945**	114,091,775	
	නැන්පතු ගෙවීම්		176,376,678	74,127,837	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		28,616,285	28,567,225	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		18,146,813	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		223,139,776	102,695,061	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,046,568,898	814,490,930	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(67,674,005)	(27,592,583)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(68,648,531)	27,592,583	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		974,526		ඒසිඒ-3
			(67,674,005)	-	

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2,024 රු.	2,023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	8,061,011,502	8,020,895,718
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	87,007,425	90,012,918
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		-
මුළු වත්කම්		**8,148,018,927**	**8,110,908,636**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(252,393,613)	(187,059,196)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		8,061,011,502	8,020,895,718
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
බදු		23,831,212	
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	314,595,300	277,072,114
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	974,526	-
මුළු වගකීම්		**8,148,018,927**	**8,110,908,636**

පිටු අංක..01....සිට ...42..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .....43.... සිට .....50.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට** අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමටත් වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 27.02.2025	දිනය : 2025-02-17	දිනය : 2025.02.19
කේ.ආර්. උඩුවාවල ලේකම් පරිසර අමාත්‍යාංශය "සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.	එච්.සී.පී. ජයවීර අධ්‍යක්ෂ ජනරාල් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පේරාදෙණිය	කේ.එල්.පී. රාජකාරුණා ප්‍රධාන ගණකාධිකාරි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පේරාදෙණිය අධ්‍යක්ෂ ජනරාල් වෙළඳනාම

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	1,366,415,878	833,193,462
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	58,123,408	44,773,980
අග්‍රිම ලැබීම්	84,999,000	57,230,000
අත්තිකාරම් අයකර ගැනීම්	28,076,544	32,638,834
තැන්පතු ලැබීම්	255,877,888	111,564,644
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,793,492,717**	**1,079,400,920**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	688,595,056	594,856,521
සහනාධාර සහ මාරුකිරීම්	39,458,166	51,495,546
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	15,373,716	17,717,296
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	760,019,651	248,795,769
අත්තිකාරම් ගෙවීම්	24,942,618	28,567,225
තැන්පතු ගෙවීම්	194,523,491	74,127,837
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,722,912,698**	**1,015,560,192**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**70,580,019**	**63,840,728**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	69,605,493	63,840,728
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**69,605,493**	**63,840,728**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**974,526**	**(63,840,728)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**974,526**	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	974,526	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි : අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වියදම් ශීර්ෂ අංකය : 322

ආදායම් සංකේතය	විස්තරය	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව	සත්‍ය ආදායම	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනස	වෙනස සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
2003.02.19	උද්භිද උද්‍යාන ආදායම	1,150,000,000	1,366,415,878	216,415,878	19%	2024 වර්ෂයේ උද්භිද උද්‍යාන වලට පැමිණි විදේශ සංචාරකයින්ගේ ප්‍රමාණය ඉහළ අගයක් ගැනීම

2025.07.17
.....
දිනය

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

කේ.එල්.පී. රාජකරුණා
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

..... 2025/07/17
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

ඩබ්.සී.පී. ජයවීර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 322 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් සභාවේ නම : ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන						
	(2) ප්‍රාග්ධන						
	උප එකතුව						
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	713,650,000	38,400,000	-	752,050,000	691,672,177	60,377,823
	(2) ප්‍රාග්ධන	156,500,000	-	-	156,500,000	131,756,945	24,743,055
	උප එකතුව	870,150,000	-		908,550,000	823,429,122	85,120,878
	මුළු එකතුව	870,150,000			908,550,000	823,429,122	85,120,878

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2025.02.15

ඩී.එල්.පී. රාජකරුණා
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම		
		100% - 90 %	75% - 89%	50 % - 74 %
1	වෘක්ෂලතා පිළිබඳ ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම			
	• ක්ෂේත්‍ර චාරිකා ගණන	√		
	• හඳුනාගත් ශාක විශේෂ		√	
	• ශාකාගාර එකතුව තර කිරීම	√		
	• නව ශාක විශේෂ සොයා ගැනීම්	√		
2	ශාක විතැන් සංරක්ෂණ කටයුතු			
	• විතැන් සංරක්ෂණ එකතුවට එක් කළ ශාක විශේෂ	√		
	• ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව			√
3	නිෂ්පාදිත පැළ ප්‍රමාණය	√		
4	පර්යේෂණ සංඛ්‍යාව	√		
5	ජාතික ශාකාගාරයේ වැඩිදියුණු කිරීම්			
	• නව ආම්පන්න මිලදී ගත් ප්‍රමාණය	√		
6	අධ්‍යාපන, පුහුණු වැඩසටහන් හා තොරතුරු බෙදාදීම			
	• අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ගණන	√		
	• තොරතුරු සැපයූ පුද්ගල ප්‍රමාණය	√		
7	උද්‍යාන වලට පැමිණෙන නරඹන්නන් සඳහා වන පහසුකම් ඉහළ නැංවීම			
	• යටිතල පහසුකම් ඉහළ නැංවීම් කටයුතු නිමකිරීම්		√	
	• නව ගොඩනැගිලි හා ආකෘති නඩත්තු කිරීම්		√	
8	මල්වගා සංවර්ධන කටයුතු			
	• පැවැත්වූ මල්වගා ප්‍රදර්ශන	√		
	• මල්වගා කරුවන්ට පැවැත්වූ පංති සංඛ්‍යාව	√		
	• ජාතික මල්වගා පර්යේෂණ සම්මන්ත්‍රණය	√		
	• මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය වැඩි දියුණු කිරීම	√		
9	කාර්ය මණ්ඩල පහසුකම් ඉහළනැංවීම			
	• සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්		√	
	• මිලදී ගත් කාර්යාල උපකරණ ප්‍රමාණය	√		
	• ඉදිකරන, නවීකරණය කරන ලද කාර්යාලීය ගොඩනැගිලි	√		
	• නවීකරණය, අලුත්වැඩියා කරන ලද නිලනිවාස			√
10	ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට දායක වීම			
	• වාර්ෂික ආදායම	√		
	• දේශීය සංචාරකයින්	√		
	• විදේශීය සංචාරකයින්	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49	50-74	75-100
සියලුම තැන්හි සියලුම ආකාරයේ දුප්පත්කම තුරන් කිරීම	ශ්‍රී ලංකාවේ මල්වගා කරුවන් සවිබල ගැන්වීම	• පිහිටවූ සමිති සංඛ්‍යාව		√	
		• පැවැත්වූ මල්වගා ප්‍රදර්ශන සංඛ්‍යාව			√
		• පැවැත්වූ පුහුණු පංති හා වැඩමුළු සංඛ්‍යාව			√
		• තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම සඳහා පැවැත්වූ රැස්වීම් හා ක්ෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව			√
		• කාලීන ගැටළු විසඳීම සඳහා සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව			√
සැමට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කර ජීවිතකාලය පුරාවට අධ්‍යාපන අවස්ථා ඇතිකිරීම	විවිධ වයස් මට්ටම්වල මහජනතාව ශාක සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම	• පරිසර ශාක හා ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ පැවැත්වූ අධ්‍යාපන වැඩසටහන්			√
	තරුණ තරුණියන් හට ස්වයං රැකියා අවස්ථා හා රැකියා සලසා ගැනීමට අවස්ථා සැලසීම	• උද්‍යානය තුල වෘත්තීය පාඨමාලා (NVQ 3, 4, 5) මඟින් තරුණ තරුණියන් පුහුණු කිරීම් සඳහා පැවැත්වූ පාඨමාලා සංඛ්‍යාව			√
		• උද්‍යානය තුල වෘත්තීය පාඨමාලා (NVQ 3, 4, 5) මඟින් පුහුණු කළ තරුණ තරුණියන් සංඛ්‍යාව			√
ජෛව විවිධත්ව සංරක්ෂණ, කාන්තාරීකරණය පිටුදැකීම වෘක්ෂලතා සංරක්ෂණය මගින් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම	ශාක විතැන් සංරක්ෂණය	• විතැන් සංරක්ෂණය කළ ශාක ප්‍රමාණය			√
		• වඳවී ගිය ශාක නැවත පිහිටි වාසස්ථාන සඳහා හඳුන්වා දුන් ප්‍රමාණය			√
		• දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය		√	
		• දැනුවත් කළ පුද්ගලයින් ප්‍රමාණය			√
සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	උද්භිද උද්‍යාන ආදායම් වර්ධනය	• නරඹන්නන් සංඛ්‍යාව			√
		• වාර්ෂික ආදායම			√

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- දෙපාර්තමේන්තුව මගින් මල්වගා සංවර්ධන වැඩසටහන් යටතේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 8500 ක් පමණ සවිබල ගැන්වීමට ක්‍රියාකර ඇත. මෙමගින් තිරසර සංවර්ධන ඉලක්ක 01 වන සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම සඳහා යන ඉලක්ක ලගා කර ගැනීමට දායක වී ඇත. මේ සඳහා විශාල වශයෙන් දායක වන්නේ කාන්තාවන්ය. මෙමගින් කාන්තාවන් සවිබල ගැන්වීමද සිදුවේ. මේ හේතුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක 05 වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලගාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීමේ අරමුණ වෙත ලඟා වීමට දායක වී ඇත. මෙමගින් ස්වයං රැකියා අවස්ථා සහ ව්‍යාපාරික අවස්ථා උදාවී ඇති බැවින් ආර්ථික සංවර්ධනයට දායක වී ඇත. මෙය තිරසර සංවර්ධන ඉලක්ක 8 වන සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ වෙත ලගාවීමේදී සෘජු දායකත්වයක් ලබා දී ඇත.
- උද්‍යානය තුළ වෘත්තීය පාඨමාලා හරහා තරුණ තරුණියන් පුහුණු කිරීම් යටතේ සිසුන් 1867ක් පමණ ප්‍රමාණයක් (NVQ 3,4) හරහා විවිධ පාඨමාලාවන් යටතේ පුහුණු කිරීම් තුළින් ඉලක්ක අංක 04 වන පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථා සැලසීම යන ඉලක්කය වෙත ලඟා වීමට හැකියාව ලැබී ඇත.
- විශේෂයෙන්ම සියලුම උද්භිද උද්‍යාන වල ශාක විතැන් සංරක්ෂණය කිරීම තුළින් හා වඳවී ගිය ශාකයන් නැවත පිහිටි වාසස්ථාන තුළ රෝපණය කිරීම තුළින් ජෛව විවිධත්ව සංරක්ෂණයට මෙන්ම ප්‍රතිෂ්ඨාපනය කර ආරක්ෂා කිරීමේ කාර්යයට දායකත්වය ලබා දී ඇත. තවද 617,600 ක පැල නිෂ්පාදනය කිරීම තුළින් ශාක ආරක්ෂා කිරීමට දායකත්වය ලබා දී ඇත. ඒ තුළින් ඉලක්ක 15 වන, භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිෂ්ඨාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්තාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන ඉලක්කය වෙත ලගා වීමට සෘජු දායකත්වයක් ලබා දී ඇත.
- සමස්ථ උද්භිද උද්‍යානවල ආදායම මිලියන 900 ක් වැනි ප්‍රමාණයකට වර්ධනය කර ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික වර්ධනයට සෘජු දායකත්වයක් ලබා දීම තුළින් ඉලක්ක 8 වන, සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන ඉලක්කය වෙත ලඟා වීමට සෘජු දායකත්වයක් ලබා දී ඇත.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජේෂ්ඨ මට්ටම	34	23	11
තෘතීය මට්ටම	9	4	5
ද්විතීය මට්ටම	180	190	10
ප්‍රාථමික මට්ටම	683	533	150
එකතුව	**906**	**750**	**176**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හා අතිරික්තය බලපෑ ඇති ආකාරය

	තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	කාර්යය සාධනයට සිදුවන බලපෑම
01	සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක සේවය)	07	මෙම නිලධාරීන් ඒකක හා අංශ ප්‍රධානීන් ලෙස හා යම් යම් විෂයන් සඳහා අධීක්ෂණ හා මෙහෙයුම් නිලධාරීන් ලෙස සේවය කරනු ලබයි. නමුත් මෙම නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම මල් වගා පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු , ශාඛ සංරක්ෂණ හා පර්යේෂණ කටයුතු,නව තාක්ෂණය භාවිතයෙන් පෙව විවිධත්ව සංරක්ෂණ හා පර්යේෂණ කටයුතු ආදී තාක්ෂණික කටයුතු වඩා ඵලදායි ලෙස ඉටු කර ගැනීමට බාධාවක් වී ඇත.
02	Landscape Architect	01	නව උද්භිද උද්‍යාන ආරම්භ කිරීමේදි හා පවතින උද්‍යාන වල භූමි දර්ශ නිර්මාණය සිදු කිරීමේදිත් සුදුසු තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකු නොමැතිවිමදෙපාර්තමේන්තුවට දැඩිව බලපානු ලැබේ.
03	උද්‍යාන සංවර්ධන සහකාර (විශේෂ ශ්‍රේණිය)	04	සහකාර අධ්‍යක්ෂ නිලධාරීන්ගෙන් පසු අධීක්ෂණ කටයුතු සිදුකරන මාණ්ඩලික නිලධාරීන් උද්භිද උද්‍යාන තුල සේවය කිරිම ආයතනයේ කාර්යය සාධනය ඉහල නැංවීමට හේතු වේ. (මෙම තනතුර අභ්‍යන්තර උසස්වීම් වන බැවින් උසස් වීමට අදාල මූලික ලේඛන සකස් කරමින් පවතී)
04	පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය)	01	
05	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිළධාරී	01	උද්භිද උද්‍යාන නැරඹීමට දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ප්‍රවේශ පත්‍ර වෙන් කිරීම හා නිකුත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම සඳහා අනුමැතිය ලැබී ඇත. තවද දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙහි පරිපාලනමය කටයුතු පිළිබඳ වගකීම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති අතර මෙම කටයුතු අධීක්ෂණය කිරීමට හා වඩා කාර්යක්ෂමව සිදුකර ගැනීම සඳහා ක්ෂේත්‍රෙය් මාණ්ඩලික නිළධාරියෙකු නොමැතිවීම දැඩිව බලපානු ලැබේ.
06	තාක්ෂණ නිලධාරි (සිවිල්)	01	දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සිදු කිරීමේදි තාක්ෂණික නිලධරියෙකුගේ අවශ්‍යතාවය දැඩිව පවතී. දැනට වෙනත් ආයතනයක සේවයේ නිරත නිලධාරියෙකු වැඩ බැලීමේ පදනම මත යොදවා ගන්නා නමුත් පූර්ණ කාලීනව සේවය ලබා ගැනීමට නොහැකිවී ඇත.
07	පර්යේෂණ සහකාර	03	පර්යේෂණ කටයුතු සඳහා විද්‍යාත්මක සේවා නිලධාරීන්ට සහාය දැක්වීම මෙම තනතුරෙහි කාර්යය භාරය වන බැවින් , තනතුරු ඌණතාවය පර්යේෂණ කටයුතු කෙරෙහි සෘජුවම බලපානු ලැබේ.
08	සංවර්ධන නිලධාරි	-38	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව පුරෝගාමී ආයතනයක් වන බැවින් විද්‍යා හා කෘෂි උපාධිධාරීන්ද, මල්වගා කටයුතු දිවයින පුරා ව්‍යාප්ත කිරීම සඳහා

			ක්ෂේත්‍රය පිළිබඳව උපාධි ලබා ඇති නිලධාරීන්ද යොදවා ගැනීමේ අවශ්‍යතාවය ඇති බැවින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීම සඳහා පවතින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් බඳවා ගැනීමට සිදු වී ඇත .
09	කළමණාකරණ සේවා නිලධාරි	04	කාර්යාලීය කටයුතු සියල්ල කෙරෙහි සෘජුව බලපානු ලැබේ.
10	ගාස්තු අයකිරීමේ සහකාර	07	උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන මහජනතාව හා සෘජුව සම්බන්ධ වන මෙම නිලධාරීන් කාර්යක්ෂමව කටයුතු කිරීම දෙපාර්තමේන්තුව කෙරෙහි මහජන ප්‍රසාදය වර්ධනය කෙරෙහි බලපානු ලබයි. මෙම කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මහජනයා අපහසුතාවයට පත්වීමෙන් දෙපාර්තමේන්තුවේ කීර්තිනාමයට හානි විය හැක.
11	උද්‍යාන වැඩ මූලික	07	ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන ප්‍රාථමික මට්ටමේ සේවකයන් අධීක්ෂණය සඳහා මෙම නිලධාරීන්ගේ හිඟය ගැටළුවක් වේ.
12	රියදුරු	07	ප්‍රධාන උද්භිද උද්‍යාන 05ක් සහ සෙසු ඒකක 16 කින් යුතු දෙපාර්තමේන්තුව මඟින් මල්වගා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ද විවිධ ව්‍යාපෘතීන් රැසක්ද සිදුවන බැවින් අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීම ආයතනයේ කාර්යක්ෂමතාවය පහළ යාම කෙරෙහි බලපානු ලැබේ.
13	කාර්යාල කාර්යය සහයක	01	දැනට සිටින සේවකයන්ගෙන් ප්‍රමුඛ කාර්යන් ඉටු කරගන්නා අතර ඇතැම් කාර්යයන් ඉටු කර ගැනීමට සේවක සංඛ්‍යාව පමාණවත් නොවන අතර, සිටින සේවකයන්ට රාජකාරි කටයුතු අධිකවීම තුළින් රැකියාවේ තෘප්තිය අඩු වීමට ද බලපානු ලැබේ.
14	ආරක්ෂක නියාමක	07	වටිනා ශාඛ හා විද්‍යාගාර වලින් යුතු උද්භිද උද්‍යාන වල ආරක්ෂාව ඉතා වැදගත් කරුණක් වන අතර ප්‍රමාණවත් ආරක්ෂක නියාමකවරුන් නොමැති වීම හේතුවෙන් පුද්ගලික ආරක්ෂක සේවාවන්හි සේවය ලබා ගැනිමට සිදු වී ඇති බැවින් දෙපාර්තමේන්තුවට මූල්‍යමය පාඩුවක් සිදුවන අතර සේවකයින්ගේ විශ්වාසීභාවය පිළිබඳ ගැටළු මතුවී ඇත.
15	උද්‍යාන සුළු පරිපාලක	12	අභ්‍යන්තර උසස්වීමකි. සුදුසුකම් ලැබූ අය නොමැත.
16	ලොරි නඩත්තුකරු	01	උද්භිද උද්‍යාන විධිමත්ව නඩත්තු කිරීම සඳහා ශිල්පීය දැනුම සහිත සේවයන්ගේ සේවය අත්‍යාවශ වේ. නමුත් ඇතැම් අවස්ථාවල තාවකාලිකව මෙම සේවකයන් වෙනත් ඒකක වලට අනුයුක්ත කර සේවය ලබා ගන්නා නමුත් ස්ථීර සේවා ස්ථානයෙහි වැඩ කටයුතු වලට බාධා පැමිණේ.
17	පෙදරේරු	01	
18	බංගලා භාරකරු	01	
19	ගබඩාකරු	03	
20	ට්‍රැක්ටර් ක්‍රියාකරු	06	
21	බැටරි කාර් ඔපරේටර්	02	
22	බද්ධකරු	03	
23	ලේබල්කරු	03	
24	බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු	01	
25	ගස් නඩත්තුකරු	02	
26	තවන්කරු	03	
27	උද්‍යාන කම්කරු	104	ප්‍රධාන උද්භිද උද්‍යාන 05ක් සහ සෙසු ඒකක 16ක නඩත්තු හා දෛනික රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේදී උද්‍යාන වල කාර්යක්ෂමතාවය සඳහා මෙම පුරප්පාඩු සෘජුවම බලපානු ලැබේ.
28	පර්යේෂණ උප සහකාර	03	අභ්‍යන්තර උසස්වීමකි. සුදුසුකම් ලැබූ අය නොමැත

6.3. මානව සම්පත් සංවර්ධනය

	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)	නිමවුම / ලබාගත් දැනුම
1.	දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගතව හා ඒ ආශ්‍රිතව රාජකාරී කරන නිළධාරීන් වෙනුවෙන් පැවැත්වූ පුහුණු වැඩසටහන	95	2024.12.18 - 2024.12.19	210,310.00	ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප, පාංශු සංරක්ෂණ පනත, පළිබෝධනාශක පනත, ව්‍යාප්ති අධ්‍යනය, ආරක්ෂිත ගෘහතුල බෝග වගාව, ආරක්ෂිත ගෘහතුල ජල සම්පාදන ක්‍රම
2.	විද්‍යාත්මක පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන	05	2024.12.03 12.12- 12.17	-	විද්‍යාත්මක පර්යේෂණ පත්‍රිකා සකස් කිරීම
3.	මු.රේ. 104 ට අදාලව හානි පාඩු ලේඛන පවත්වා ගැනීම.	**65**	2024.11.26	13,360.00	මු.රේ. 104 ට අදාලව හානි පාඩු ලේඛන පවත්වා ගැනීම.
4.	මෝටර් රථ රියදුරන් වෙනුවෙන් පවත්වන පුහුණු වැඩසටහන	16	2024.11.26	4,500.00	මෝටර් රථ රියදුරන්ගේ රාජකාරී සහ වගකීම්, රජයේ වාහන නඩත්තුව හා ආරක්ෂාව, දෛනික ධාවන සටහන් පොත් නඩත්තුව, වාහන ඉන්ෂෙන්ට්‍රී පවත්වාගෙන යාම, වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු, වාහන අනතුරු සම්බන්ධ ගතයුතු ක්‍රියාමාර්ග. පිළිබඳ දැනුම
5.	සංචාරක බංගලා භාරකරු සහ සහයක තනතුරේ රාජකාරී සම්බන්ධ කාර්යක්ෂමතා පරීක්ෂණයට අදාල පුහුණු වැඩ සටහන	06	2024.10.01	4,920.00	කාර්ය පටිපාටික රීති/ මුදල් රෙගුලාසි/ආචාරධර්ම/ආගන්තුක සත්කාරය/කාමර සරකසීම/නවීන කෑම සැකසීම
6.	ප්‍රසම්පාදනය කොන්ත්‍රාත් මූල්‍ය කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන	100	2024.10.03	60,600.00	රාජ්‍ය විගණනය හා කළමණාකරනය
7.	බැටිරි කාර් රියදුරු තනතුරේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන	20	2023.11.01	7,350.00	බැටිරි කාර්වල යාන්ත්‍රික හා විද්‍යුත් ක්‍රියාකාරීත්වය, සුළු අළුත්වැඩියාවන් හා ලිහිසි තෙල් භාවිතය
8.	කණිෂ්ට කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (අංක 07)	95	2024.08.30	52,550.00	කාර්ය පටිපාටි සංග්‍රහය,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, විෂයානුබද්ධ දැනුම,තනතුරට අයත් රාජකාරී සම්බන්ධ දැනුම.

	වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)	නිමවුම / ලබාගත් දැනුම
9.	කණිෂ්ට කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (අංක 06)	85	2024.08.28	59,400.00	කාර්ය පටිපාටි සංග්‍රහය,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, විෂයානුබද්ධ දැනුම,තනතුරට අයත් රාජකාරී සම්බන්ධ දැනුම.
10.	කණිෂ්ට කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (අංක 05)	30	2024.08.21	59,400.00	කාර්ය පටිපාටි සංග්‍රහය,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, විෂයානුබද්ධ දැනුම,තනතුරට අයත් රාජකාරී සම්බන්ධ දැනුම.
11.	කණිෂ්ට කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (අංක 04)	65	2024.08.13	34,005.00	කාර්ය පටිපාටි සංග්‍රහය,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, විෂයානුබද්ධ දැනුම,තනතුරට අයත් රාජකාරී සම්බන්ධ දැනුම.
12.	කණිෂ්ට කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (අංක 03)	75	2024.08.07	47,382.50	කාර්ය පටිපාටි සංග්‍රහය,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, විෂයානුබද්ධ දැනුම,තනතුරට අයත් රාජකාරී සම්බන්ධ දැනුම.
13.	කණිෂ්ට කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (අංක 02)	40	2024.08.02	22,081.00	කාර්ය පටිපාටි සංග්‍රහය,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, විෂයානුබද්ධ දැනුම,තනතුරට අයත් රාජකාරී සම්බන්ධ දැනුම.
14.	කණිෂ්ට කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය පැවැත්වීමට අදාල පුහුණු වැඩ සටහන (අංක 01)	96	2024.08.06	38,765.00	කාර්ය පටිපාටි සංග්‍රහය,ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, විෂයානුබද්ධ දැනුම,තනතුරට අයත් රාජකාරී සම්බන්ධ දැනුම.
15.	Dream Gardens තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා වූ පුහුණු වැඩසටහන	46	2024.07.18	33,165.00	සියළු උද්‍යානවල පස් අවුරුදු සැලැස්ම සැකසීම
16.	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිළධාරීන් සඳහා වන සේවාරම්භක වැඩසටහන	15	2024.02.20	1,760.00	තනතුරට අදාල රාජකාරී දැනුම හා දෙපාර්තමේන්තුව පිළිබඳ අවබෝධයක් ලැබීම.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.6	වෙනත්	අදාල නැත		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනයාම	අදාල නැත		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	භාණ්ඩාගාර ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍යපාලනය සඳහා කාර්යන් අභියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසුම් සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම			
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රධාන කාර්යාලයේ ගිණුම් හා ආයතන අංශ වලින් පිළිතුරු ලැබී නැත	ප්‍රධාන ගණකාධිකාරී හා අධ්‍යක්ෂ පාලන දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණනවාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල්රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත්විගණකාධිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු	අනුකූල වේ		
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂයතුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදයට අනුව, වත්කම් මිලදීගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිතවාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්තික වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග්	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කරතිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකමවලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ටවලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකටවැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදුතැන්පත් ගිණුම**			
13.1	කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදුතැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	පවත්වාගෙන යාම			
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත කළ තක්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තක්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කරතිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානවසම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	සේවා අවශ්‍යතාවය මත (ලබා ඇති උපාධිය මත) සංවර්ධන නිළධාරී සේවයේ නිළධාරීන් ලබා ගැනීම.	සේවක සංඛ්‍යාව වැඩිකර ගැනීමට කටයුතු කිරීම. 9සංවර්ධන නිළධාරී සේවය) සේවා අවශ්‍යතාව මත සේවක සංඛ්‍යාව වැඩිකර ගැනීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය මේ වන විටත් ඉල්ලා ඇත.
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම			
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැ ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක්වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානවසම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවරු කොට තිබීම	අනුකූල නොවේ	ප්‍රතිපාදන සීමාසහිත වීම නිසා සැලසුම් කල වඅඩසටහන් පැවත්වීමට නොහැකි විය	මූල්‍ය කළමණාකරණ පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණය මත ප්‍රතිපාදන සීමිත කර ඇති බැවින් රජයේ තීරණ මත මෙය සංවිධානය කරනු ලැබේ.

අංකය	අදාළ කර ගත යුතුඅවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහතසඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ (ආයතන අංශයේ සියළුම නිළධාරීන් සම්බන්ධයෙන්)		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම	අනුකූල වේ		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා වූ භාර අරමුදල

වාර්ෂික වාර්තාව - 2024 වර්ෂය

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් 1995.12.15 වැනි දින එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ගරු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යානවලට ඇතුළුවීම සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා වූ භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රීම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනීම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනීමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

<u>උද්භිද උද්‍යාන භාර අරමුදල</u>

1. අරමුදලේ නම : **ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල**

2. ස්වභාවය : **උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු, සුභ සාධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම**

3. අදාල චක්‍රලේඛයන් : **I** අරමුදල ආරම්භ කිරීම - **1917** අංක **09** දරණ අරමුදල් ආඥා පනත අනුව

II ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ **1977** අගෝස්තු **16** දිනැති අංක **836** දරණ චක්‍රලේඛය හා **2006.12.22** දින නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ **PF/423** අනුව

4. ආරම්භ කළ දිනය : **1996** දෙසැම්බර් **20**

5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය

6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුව : ගිණුම් අංක **0007040848**

7. අරමුදලේ පරමාර්ථ:

- ✓ උද්භිද උද්‍යාන පිළිබඳව ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල ඇති ආකල්ප ප්‍රසස්ථ කිරීමට අදාලව ක්‍රියාකාරකම් සිදු කිරීම.
- ✓ පාරිසරික හා අධ්‍යාපනික ලෙස පැළෑටි සංරක්ෂණය සඳහා අර්ථවත් වැඩසටහන් ඇරඹීම හා දියත් කිරීම.
- ✓ උද්භිද උද්‍යානයනවල සේවය කරන විද්‍යාඥයින්ට තම විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩිදියුණු කරගැනීම සඳහා මූලාශ්‍රය සැපයීම හා ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ ඕනෑම ද්‍රව්‍යයක් මිලදී ගැනීම.
- ✓ පැළ එකතුව වර්ධනය කරගැනීමට පියවර ගැනීම.
- ✓ තාක්ෂණික ක්ෂේත්‍රවල සිදු කරන උද්භිද උද්‍යාන සංවර්ධනයට තුඩු දෙන පාරිසරික, අධ්‍යාපනික, සංරක්ෂණ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා සහාය වීම.
- ✓ විද්‍යාඥයින්ට පහසුකම් සැලසීම හා උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන ජනයාට අවශ්‍ය කරන හදිසි තැනීම් ඉදිකිරීමට පියවර ගැනිම.
- ✓ විශේෂිත වූ වැඩසටහන් සඳහා පුනරාවර්තන අරමුදල් හිඟයන් පිරිමැසීම.

2024 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය

2024 -01-01 දිනට බැර ශේෂය = රු 247,300,684.95

එකතු කළා:

2024 වර්ෂයේ ආදායම (බැර කිරීම්) = රු. 38,337,664.61

එකතුව රු.

අඩු කළා :

2024 වර්ෂයේ වියදම් (හර කිරීම්) = රු. 81,580,949.75

2024.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය = රු **290,543,970.09**

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමණි)

අරමුදලේ ප්‍රධාන පරමාර්ථයක් වන ‘‘ශ්‍රී ලංකාව තුල හා විදේශ රටවල් තුල ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තව දුරටත් ඉහල නැංවීම’’ අරමුණු කරගෙන පහත සඳහන් කටයුතු අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2023 වර්ෂයේ දී ඉටු කරන ලදී.

- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලෙස පරිසර හිතකාමී සෞන්දර්යාත්මක දැක්ම පෙරදැරි කරගනිමින් උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් උදෙසා සිහිවටන හා සමරු තිළිණ අලෙවි කිරීම වෙනුවෙන් මෙම වර්ෂයේදී උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් කාන්තා අත්බෑග්,හිස් වැසුම්, යතුරු අධාරක සහ ටේබල් මැට මිලදි ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 2.7 ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී.



දෙස් විදෙස් සංචාරකයින් සඳහා අලෙවි කිරීමට මිලදි ගනු ලැබූ අත්බෑග්,හිස් වැසුම්, යතුරු අධාරක සහ ටේබල් මැට වලින් කොටසක්

අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය

- 2024 වර්ෂයේ මල් වගාව හා උද්‍යාන අලංකරණ වැනි අංශ කෙරෙහි උනන්දුවක් දැක්වූ පාර්ශව සඳහා පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ ආදිය අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදී.

- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව ලබා දී ඇති අතර, එම පාඨමාලාවන් යටතේ පුහුණුව ලබන පුහුණු ලාභීන් ඔවුන් ඉටු කරන ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලට අදාලව උද්‍යානයේ විවිධ අංශවල සංවර්ධන කටයුතු හා නඩත්තු කටයුතු සඳහා ඔවුන්ගේ ශ්‍රමය ලබා දීමෙන් දායක වේ. එහිදී ඇති වන මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමට භාර අරමුදල කටයුතු කරන ලදී.

  මේ සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල මගින් රුපියල් මිලියන 1.5 ක පමණ වියදම් දරණ ලදී.

අනු අංකය	පාඨමාලාව	කාලච්ඡේදය	සහභාගී වූ ගණන
01	NVQ Level – 5 මල්වගා හා උද්‍යාන අලංකරණය පිලිබඳ ජාතික ඩිප්ලෝමාව	අවුරුදු 01 මාස 06	10
02	NVQ Level – 4 උද්‍යාන අලංකරණ ශිල්පී පාඨමාලාව	අවුරුදු 01 මාස 06	09
03	සිවු මාසික මල් වගාව හා උද්‍යාන අලංකරණ පාඨමාලාව	මාස 04	94
04	NVQ Level – 4,5 සහ 6 පාඨමාලාවන් හදාරන සිසුන් සඳහා රැකියා පුහුණුව මත සිදු කෙරෙන පාඨමාලාව	මාස 06	151
05	උපාධි අපේක්ෂක සිසුන් සඳහා සිදු කෙරෙන පෙව විවිධත්ව තාක්ෂණය පිළිබඳ අන්තර් පුහුණු වැඩසටහන	මාස 06	04
06	මොරටුව විශ්ව විද්‍යාලයෙහි භූ විද්‍යාව හා ගෘහ නිර්මාණ ශිල්පය හදාරන සිසුන් සඳහා සිදු කෙරෙන මොඩියුල තාක්ෂණය පිළිබඳ පාඨමාලාව	මාස 06	17



NVQ Level – 5 මල්වගා හා උද්‍යාන අලංකරණය පිලිබඳ
ජාතික ඩිප්ලෝමාව හදාරණ සිසුන් පිරිසක්



NVQ Level – 4 උද්‍යාන අලංකරණ ශිල්පී පාඨමාලාව
හදාරණ සිසුන් පිරිසක්



සිව් මාසික මල් වගාව හා අලංකරණ පාඨමාලාව හදාරණ සිසුන් පිරිසක්

ජාතික ශාකාගාරය

2024 වර්ෂයේ දී ජාතික ශාකාගාරය මගින් සිදුකල සුවිශේෂී කාර්යන්

වර්ෂ 2024 දී අභිමානවත් 200 වසක් සපුරන ශ්‍රී ලංකාවේ ජාතික ශාකාගාරය, ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද උද්භිද විද්‍යා ක්ෂේත්‍රයට සුවිශේෂී වූ කාර්යභාරයන් රැසක් සිදු කරන්නාවූ ආයතනයකි. උද්භිද විද්‍යා ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා මහඟු කාර්යභාරයක යෙදෙන ජාතික ශාකාගාරය, උද්භිද විද්‍යා අධ්‍යනයන් සිදුකරන හා දේශීය ශාක පිළිබඳ උද්භිද විද්‍යාත්මකව නිවැරදි තොරතුරු ලබාදීමේ කාර්යෙහි ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ක්‍රියාත්මක වේ.

තවද ශ්‍රී ලංකාව තුළදී නිවැරදිව ශාකයක් හඳුනාගෙන, උද්භිද විද්‍යාත්මක නාමය තහවුරු කිරීමද ජාතික ශාකාගාරය මගින් පමණක්ම සිදුකරන්නාවූ ජාතික කාර්යකි.

වර්ෂ 2013 සිට අඛණ්ඩව සිදු කෙරෙන ජාතික ශාක ගවේෂණ වැඩසටහන, ජාතික ශාකාගාරය මඟින් සිදුකෙරෙන ප්‍රධානතම තාක්ෂණික වැඩසටහනක් වේ. මෙමඟින් රැස් කරන සියළු ශාක නිදර්ශක දැනට, ජාත්‍යන්තර ශාකාගාර ක්‍රමවේදයන්ට අනුව නඩත්තු කටයුතු සිදු කර පවත්වා ගෙන යනු ලබන ප්‍රධාන ශාක නිදර්ශක එකතුව (National Plant Repository) වෙත යොමු කර සංරක්ෂණය සිදු කරයි. ජාතික ශාක ගවේෂණ වැඩසටහන මඟින් රැස්කරනු ලබන දත්ත හා ඊට අදාල විද්‍යාත්මක හා ගවේෂණාත්මක තොරතුරුද, දේශීය හා අන්තර්ජාතික වශයෙන් බොහෝ ක්ෂේත්‍රයන්ගේ විවිධ කටයුතු සඳහා සෘජු දායකත්වයක් දක්වයි. විශේෂයෙන් දේශීය වශයෙන් සිදුකරන ශාක අධ්‍යයන හා පර්යේෂණ, දේශීය හා බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයන්හි විවිධ පර්යේෂණ සඳහාද දේශීය ආයුර්වේද නිෂ්පාදන කටයුතු වලදී හා විවිධ නෛතික කටයුතු සඳහා ශාක වල උද්භිද විද්‍යාත්මක නාමය තහවුරු කිරීමට (Plant

Authentication) මෙම දත්ත මූලික වශයෙන් යොදා ගනු ලැබේ. එසේම ජෛව විවිධත්ව සංරක්ෂණ, පාරිසරික අධ්‍යයන හා වෙනත් පාරිසරික සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා මෙම ශාක ගවේෂණ වැඩසටහන තුලින් රැස් කරනු ලබන තොරතුරු හා දත්තයන් මූලාශ්‍ර ලෙස භාවිතා කරයි.

තර්ජනයට ලක් වූ ශාක ගවේෂණය හා සංරක්ෂණය ප්‍රධාන ඉලක්කය කර ගනිමින් 2024 ජාතික ශාකගවේෂණ වැඩසටහන සැලසුම් කරන ලද අතර, එය ප්‍රධාන ව්‍යාපෘති 03ක් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි.

ව්‍යාපෘති 1- හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතය ගවේෂණය

ව්‍යාපෘති 2- ගම්පහ දිස්ත්‍රික්කයේ ශාක ගවේෂණය

ව්‍යාපෘති 3-ලංකාවේ සත්‍ය කඩොලාන විශේෂ සම්බන්ධ සංසන්දනාත්මක දැව ව්‍යුහ විද්‍යාත්මක අධ්‍යයනය

ව්‍යාපෘති 4- *Diospyros* (කළුවර) ශාක ගණයේ තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය කිරීමසහ වෙනත් ගවේෂණ වැඩසටහන්

ඒ අනුවඑක්දින ශාක ගවේෂණ වැඩසටහන් 16 ක් ක්‍රියාත්මක කරන ලද අතර2024වර්ෂයේ දී ශාක ගවේෂණ කටයුතු මඟින් හා ශාක හඳුනාගැනීම් (Based on exploration and Identification) මඟින් රැස්කරන ලද දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවේ සපුෂ්පීය ශාක නිදර්ශක 280 ක් රැස්කර ඇති අතර ඉන් 230උද්භිද විද්‍යාත්මකව හඳුනාගෙන ඇත.



විවිධ පරිසර පද්ධති තුළ ශාක ගවේෂණ කාර්යයන් වල යෙදෙමින්

ව්‍යාපෘති 1 - හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතය ගවේෂණය

2024 වසරේදී හක්ගල දැඩි ස්වභාවික රක්ෂිතය ගවේෂණය සඳහා එක් දින ගවේෂණ වාර 06ක් සැලසුම් කල අතර ගවේෂණ වාර 07ක් සිදු කරන ලදි. රැස් කර ගන්නා ලද ශාක නිදර්ශක අතුරින් විශේෂ 110ක්

හඳුනාගෙන ඇත. 2020 රතු දත්ත ලැයිස්තුවට අනුව දැඩි ලෙස වඳවීමේ තර්ජනයට ලක්ව ඇති (CR) ශාක විශේෂ 07ක් ස්වභාවික පරිසරය තුළින් හඳුනා ගන්නා ලදි. මෙය ජාතික ශාක ගවේෂණ වැඩසටහනක් තුල අනාවරණය කරගතන්නා ලද වැඩිම CR කාණ්ඩයට අයත් ශාක විශේෂ ගණන වේ.


එසේම ඉන් එක් විශෙෂයක් නව ශාක විශේෂයක් වීම සුවිශේෂීවේ. එම ශාක විශේෂය *Coleus hakgalensis*ලෙස නම් කර Phytotaxa ජ්‍යාත්‍යන්තර සඟරාවේ ප්‍රකාශයට පත් කරන ලදි.

Coleus hakgalensis Abeysekara, Kasunika, Haluwana & Nilanka

දැඩි ලෙසවඳවීමේ තර්ජනයට (CR) ලක්ව ඇති මෙමශ්‍රී ලංකාවට ආවේණික විශේෂය හක්ගල කන්දේ නැගෙනහිර බෑවුමේ ඉතා ඉහල උන්නතාංශ (2000m) ආශ්‍රිතව ගල් පර්වත මත හමු විය.

දැනට මෙම විශේෂය හක්ගල උද්භිද උද්‍යානයේ සංරක්ෂණය(Ex-situconservation)සිදුකර ඇත.තවදමෙම විශේෂය විසිතුරු ශාකයක් ලෙස භාවිතා කිරීම සඳහා පරීක්ෂණ සිදු වෙමින් පවතී





Phytotaxa 670 (2): 127–132
https://www.mapress.com/pt/
Copyright © 2024 Magnolia Press

Article

ISSN 1179-3155 (print edition)
PHYTOTAXA
ISSN 1179-3163 (online edition)

https://doi.org/10.11646/phytotaxa.670.2.5


Coleus hakgalensis (Lamiaceae), a new species from Sri Lanka

SUMEDHA ABEYSEKARA[1,4*], OVITI MULLAGE KASUNIKA[1,5], NISHANTHI HALUWANA[2,6*] & NADUN NILANKA[3,7]

[1]*National Herbarium, Department of National Botanic Gardens, Peradeniya 20400, Sri Lanka*
[2]*National Herbarium, Department of National Botanic Gardens, Peradeniya 20400, Sri Lanka*
[3]*Department of Wildlife Conservation, Battaramulla 10120, Sri Lanka*
[4] *sumedhabin@gmail.com; https://orcid.org/0009-0000-8953-0187*
[5] *kasunikaovitimullage@gmail.com; https://orcid.org/0000-0002-1269-4391*
[6] *nishanthihaluwana@gmail.com; https://orcid.org/0009-0001-2492-8167*
[7] *ngnnilanka@gmail.com; https://orcid.org/0009-0006-1118-6535*
**Corresponding author*

Abstract

Coleus hakgalensis, a new species in family Lamiaceae, is described from the central highlands of Sri Lanka. The dry specimens of the new species are morphologically similar to *Coleus paniculatus* specimens but distinguishable by its much branched habit with arcuate branches, stem up to 1m in height, elongated inflorescence, bracts being occasionally persistent and shortly petiolated, having hairs inside the upper lip of calyx, semi-circular lateral lobes of upper lip of corolla being much shorter than median lobes, navicular lower lip of corolla with densely pilose inside, stamens united at base and anterior projection of the disc equal or shorter than ovary with an acute apex. The new species is under high risk of extinction in the wild thus ex-situ conservation measures have been implemented.



පර්යේෂණ පත්‍රිකාවේ කොටස්



හක්ගල උද්භිද උද්‍යානයේ විතැන් සංරක්ෂණය **(Ex-situ conservation)** සිදුකරඇත.

2024 හක්ගල ගවේෂණ වලදී හමු වූ දැඩි ලෙස වඳවීමේ තර්ජනයටලක්ව ඇති අනෙකුත් ශාක විශේෂ

*Gynura hispida*Thwaites

ශ්‍රී ලංකාවට ආවේණික මෙම විශේෂය වසර 55 කට පසු නැවත සොයා ගන්නා ලදී. නැඟෙනහිර හක්ගල කඳු මුදුනේ කුරු වනාන්තරයේ පාෂාණ හා ශාක අතර මේවායේ ශාක කිහිපයක් හමු විය. දැනට පවතින තොරතුරුවලට අනුවමෙයසජීවීව හමුවන එකම ස්ථානයහක්ගල දැඩි රක්ෂිත වනාන්තරය වේ.







01



02

ලංකාවට ආවේණික ශාක විශේෂ 02 කි.

01.*Sophora zeylanica* Trimen

02.*Tragiamontana*(Thwaites) Müll.Arg. (වැල් විශේෂයකි)



Korthalsella japonica (Thunb.) Engl.
කුඩා අර්ධ පරපෝෂිත ශාකයකි



Allium hookeri Thwaites
ලූනු පවුලේ විශේෂයකි



Daphniphyllum neilgherrense (Wight) K.Rosenthal
කඳුකර ප්‍රදේශය ආශ්‍රිතව හමුවන ශාක විශේෂයකි

හක්ගල දැඩි රක්ෂිත ප්‍රධාන වශයෙන්ම ආක්‍රමණශීලී ශාක වලින් තර්ජනයට ලක් වී ඇත. මේ අතරින් *Cestrum aurantiacum*හා *Ageratina riparia* සැලකියයුතු බලපෑමක් පවතින අතර*Ageratina riparia* මර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් හදුනාගෙන ඇත.

ව්‍යාපෘති 2- ගම්පහ දිස්ත්‍රික්කයේ ශාක ගවේෂණය

ගම්පහ දිස්ත්‍රික්කයේ වෘක්ෂලතා ගවේෂණය 2022 හා 2023 වර්ෂ වල සිදු කරනු ලදි. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ රක්ෂිත වනාන්තර, සංවේදී හා ද්විතික පරිසර ප්‍රදේශ ආශ්‍රිතව

සිදුකරන ලදී. මුතුරාජවෙල තෙත් බිම් ආශ්‍රිතව ශාක ගවේෂණයක් මෙම වර්ෂය තුල සිදුකරන ලදී. ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතින් සඳහා මෙම සමීක්ෂණයෙන් එක්රැස් කරන ලද දත්ත සහ තොරතුරු ප්‍රයෝජනවත් වේ.

zzමෙම ගවේෂණයේ දී සපුෂ්ප ශාක නිදර්ශක 40 ක් එක් රැස් කරන ලදී. ඉන් මෙතෙක් හඳුනාගෙන ඇති සපුෂ්ප ශාක විශේෂ 25 න් විශේෂ 4 ක් ජාතික රතු ලැයිස්තුවට අනුව තර්ජනයට ලක්වූ ශාක විශේෂ කාණ්ඩයට අයත්ය.










ක්ෂේත්‍ර කටයුතු අතරතුර

ව්‍යාපෘති 3 - ශ්‍රී ලංකාවේ සත්‍ය කඩොලාන විශේෂ සම්බන්ධ සංසන්දනාත්මක දැව ව්‍යුහ විද්‍යාත්මක අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ කඩොලාන විශේෂවල දැව ව්‍යුහ විද්‍යාව පිළිබඳ තොරතුරු නොමැතිකම හේතුවෙන්නීතිමය ගැටළු පැනනගින විටදී දැව කොටස් විද්‍යාත්මකව හඳුනා ගැනීමේදී ඇති වනදුෂ්කරතාවය මඟහරවා ගැනීමට 2023 වසරේදී දැව ව්‍යුහ විද්‍යාත්මක අධ්‍යයනය ආරම්භ කල අතර මෙහිදී එක්රැස් කරන ලද දත්තනීතිමය කටයුතු වලදීනිවැරදිවදැව විශේෂයහඳුනා ගැනීමටඋපයෝගී කර ගත හැක.

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් තෝරාගත් කඩොලාන පරිසර පද්ධති කෙරෙහි අවධානය යොමු කරන ලදී. 2024 දී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් ක්ෂේත්‍ර ගවේෂණයක් සිදු කරන ලදී. සත්‍ය කඩොලාන විශේෂ 07 ක්, කඩොලාන ආශ්‍රිතයන්, ලුණු වගුරු ආශ්‍රිත ශාක විශේෂ සහ අනෙකුත් ආවෘත බීජක ශාක ඇතුළු ශාක නිදර්ශක 55 ක් එකතු කරන ලද අතර 40 ක් හඳුනා ගැනීම සිදු කරන ලදී.

සත්‍ය කඩොලාන විශේෂ 03 ක ස්ථිර අන්වීක්ෂීය කදා 18 ක් සකස් කරන ලද අතර ඒවායේ අන්වීක්ෂීය ව්‍යුහයන් ඩිජිටල් ලෙස ඡායාරූප ගත කරන ලදී. සත්‍ය කඩොලාන විශේෂ 19 ක ව්‍යුහ විද්‍යාත්මක ලක්ෂණ මත පදනම්ව දත්ත සමුදාය(data base) සකස් කර ඇත.



සත්‍ය කඩොලාන අන්වීක්ෂීය ඩිජිටල් ඡායාරූප



ව්‍යාපෘති 4 - වෙනත් ගවේෂණ වැඩසටහන්

පින්නදූව - අක්මීමන යෝජිත කඩොලාන උද්‍යානයේ ශාක ගවේෂණය

පින්නදූව - අක්මීමන යෝජිත කඩොලාන උද්‍යානයේ දැනට පවතින කඩොලාන ශාක විශේෂ හඳුනාගැනීම සඳහා ශාක ගවේෂණ වැඩසටහනක් සිදු කරන ලදි. සමීක්ෂණය කරන ලද වපසරිය තුළින් සත්‍ය කඩොලාන ශාක විශේෂ පහක් හඳුනාගන්නා ලදි. 2020 රතු දත්ත පොතට අනුව මින් ශාක විශේෂ දෙකක් වඳ වීමේ යාමේ තර්ජනයට ලක් වී ඇත.



පින්නදූව - අක්මීමන යෝජිත කඩොලාන උද්‍යානයේ මායිම් දර්ශනය





වඳවීමේ යාමේ තර්ජනයට ලක් වී ඇතිවිශේෂ
1 ***Bruguiera gymnorhiza*** **(L.) Lam.,** **2. *Bruguiera sexangula* (Lour.) Poir.**

ව්‍යාපෘති 4 - - *Diospyros* (කළුවර) ශාක ගණයේ තර්ජනයට ලක් වූ විශේෂ සංරක්ෂණය කිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා කොට්ටව/කන්නෙලිය, නකල්ස්, කැගල්ල සහ කුරුණෑගල ආශ්‍රිත ප්‍රදේශවල එක් දින ගවේෂණ කටයුතු 04 ක් සිදු කර ඇත. මෙහිදී ලබා ගත් *Diospyros* විශේෂ සඳහා DNA නිස්සාරණය 24 ක් මේ වසර තුළ සිදු කරන ලදි. වියළි නිදර්ශක තැන්පත් කිරීම සඳහා අවශ්‍ය සාම්පල මෙන්ම ශාක සංරක්ෂණය සඳහා අවශ්‍ය ප්‍රචාරණ ද්‍රව්‍ය ලෙස බීජ ද එකතු කරන ලදී.

උද්භිද උද්‍යාන භාර අරමුදල - 2024 වර්ෂයේ වියදම්

	කාර්යය	ඇස්තමේන්තුව (රු.)	2024-12-31 දිනට මුළු වියදම් (රු.)	ඉතිරි මුදල (රු.)
1	භාර අරමුදලේ වියදම්	1,250,000.00	1,134,079.20	115,920.80
2	උද්භිද උද්‍යාන වල පහසුකම් වැඩි දියුණු කිරීමේ වියදම්	7,200,000.00	7,200,000.00	0.00
3	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම්	1,200,000.00	1,179,992.21	20,007.79
4	හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම්	2,000,000.00	0.00	2,000,000.00
5	වන ඖෂධ උද්‍යානයේ සංවර්ධන වියදම්	13,500,000.00	13,001,529.21	498,470.79
6	ජාතික ශාකාගාරයේ සංවර්ධන වියදම්	10,150,000.00	10,150,000.00	0.00
7	වියළි කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම්	1,700,000.00	1,679,408.76	20,591.21
8	අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථාන වියදම්	1,500,000.00	1,500,000.00	0.00
එකතුව		37,000,000.00	35,845,009.38	2,654,990.59

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CPCG/KD/H/DNBG/2025/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 අප්‍රේල් 28 දින

ගිණුම් අංශය ලැබුණා 28 APR 2025 05 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය

ගණන්දීමේ නිලධාරී
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමඟ එවා ඇත.

02. එම වාර්තාවේ සාවද්‍ය හෝ එකඟ විය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම්, මෙම ලිපියේ දින සිට දින හතක් ඇතුළත පහත ලිපිනයට දැන්වීමට කටයුතු කළයුතු අතර, මෙම කරුණු පිළිබඳ තවදුරටත් ඔබ සාකච්ඡා කිරීමට අදහස් කරන්නේ නම් ඒ බව දින තුනක් ඇතුළත මා වෙත දන්වා කාල වේලාව වෙන්කර පැමිණෙන්නේ නම් මැනවි.

03. ඉහත සඳහන් පරිදි දින හතක් ඇතුළත පිළිතුරක් නොලදහොත් කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණුවලට ඔබ එකඟ වූ ලෙස සලකා එම වාර්තාව පදනම් කරගෙන අවසාන වාර්තාව නිකුත් කරන බව කාරුණිකව සලකන්න.

පිළිතුරු එවිය යුතු ලිපිනය : විගණන අධිකාරී,
ජාතික විගණන උප කාර්යාලය (CPCG/KD/H),
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

එම්.කේ.ඩී.එන්.මායාකඩුව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

(කෙටුම්පත)

"රහසිගතයි"

CPCG/KD/H/DNBG/2025/08

ගණන්දීමේ නිලධාරී

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සම්න්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

1.1 මතය

මෙම වාර්තාවේ දැක්වෙන මාගේ නිරීක්ෂණයන් සඳහා ඉදිරිපත් කරන ලද පිළිතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව විගණන මතය තීරණය කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන

පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.4.1 ආදායම් නොවන ලැබීම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) වටිනාකම රු. 23,831,212 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණද පෙර වර්ෂයට අදාළව 2025 ජනවාරි මස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුදල රු.22,520,512 ක් විය. විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වටිනාකම රු.22,838,875 ක් ලෙස තහවුරු විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලැබීම්වලට අදාළ එකතු කළ අගය මත බදු වටිනාකම හඳුනා ගැනීමේදී 2024 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාළව රු.782,559 ක වෙනසක් පැවතුණි.

1.4.2 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂය තුල ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එකතුව රු.50,718,236 ක් වූ මූලධන වියදම් දරා තිබුණත්, ACA - 6 ආකෘතිය තුළ එම වටිනාකම ප්‍රාග්ධනිත කිරීම රු.9,663,966 ක් එනම්, සියයට 19 ක් පමණක් විය. ඒ අනුව මූලධන වියදම්වලින් සියයට 81 ක් තුල පැවති ප්‍රාග්ධනිත ස්වරූපී වියදම් හඳුනාගෙන ACA - 6 ආකෘතිය තුළ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

1.4.3 මූල්‍ය නොවන වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ ප්‍රධාන පිවිසුම අසල 2013 වර්ෂයේදී ඉදිකරන ලද වෙළඳ කුටි 12 ක් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ආ) සමාලෝචිත වර්ෂයේ අත්පත් කරගත් වත්කම් නිසිපරිදි වර්ගීකරණය නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ACA - 6 ආකෘතියේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම්වල වටිනාකම සහ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ACA – 2 (i) ආකෘතියේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ දක්වා තිබුණු වියදම් වටිනාකම් අතර වත්කම් විෂයන් 02 කට අදාළව වෙනසක් පැවතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ඇ) 2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 කට වරක් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කළ යුතු වුවද, ජාතික උද්භිද උද්‍යානය සතු ඉඩම් හා ගොඩනැගිලිවල රු.7,631,911,841 ක් වූ පිරිවැය වටිනාකම අවසන් වරට 2016 තක්සේරු කර තිබුණු අතර, ඒ අනුව වත්කම් තක්සේරු කර වසර 08 ක කාලයක් ගතවී තිබුණද, නැවත තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශය තුළ 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම මූලධන වැය විෂය යටතේ රු.41,054,270 ක් වැය දරා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. ACA - 6 ආකෘතිය තුළ එකතු වටිනාකම රු.24,288,671 ක් වූ ඉඩම් මිලදී ගැනීමක් මෙන්ම එම වටිනාකමින්ම ඉඩම් අපහරණයක් ව්‍යාජ ලෙස හෙළිදරව් කර තිබුණි.

ii. ACA - 2 (ii) ආකෘතියේ වියදම් ප්‍රකාශය තුළ මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් යටතේ වැය ශීර්ෂය 322 හී 2105 වැය විෂය මඟින් සමාලෝචිත වර්ෂය තුල දරන ලද රු.16,864,235 ක් වූ වැය තුළ ඇතුළත් ප්‍රාග්ධනීත කළ යුතු ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් ACA - 6 ආකෘතිය තුළ ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, එම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකරන ලද ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් හඳුනාගෙන නොනිමි වැඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

1.4.4 **තැන්පතු ගිණුම් ශේෂය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ශේෂය තුල පවතින (6000-0-0-13-57) අංක දරන ගිණුම් අංකය වූ රු.6,057,375 ක ශේෂය තුල තැන්පත්කරු හඳුනා නොගත් රු.10,000 ක ශේෂයන් 02 ක් පැවතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

1.4.5 **අග්‍රිම ශේෂය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂ වූ රු.974,526 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවද එම ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා නොතිබීමෙන් එම වටිනාකමින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

1.4.6 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ACA 6 ආකෘතියේ සඳහන් එකතුව රු.8,061,011,502 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ බව පැවසුවද, එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ආ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ACA 6 ආකෘතියේ අපහරණය කිරීම් ලෙස රු.29,944,850 දක්වා තිබූ අතර එම ශේෂය තුල වූ පිරිවැය රු.45,600 ක් වූ අයිතම 9 ක භාණ්ඩවල පිරිවැය අපහරණ වාර්ථාවේ සඳහන් කර නොතිබූ අතර, ඉතිරි වටිනාකම සනාථ කිරීම සඳහා සමීක්ෂණ වාර්තා හෝ වෙනත් ලියවිලි විගණනයට ඉදිරිපත් නොවූ බැවින්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අපහරණ වටිනාකම විගණනයේදී තහවුරු කරගත නොහැකිවිය.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

1.4.7 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් රජයේ නිවාස සම්බන්ධ පොරොත්තු ලේඛනය පවත්වා නොතිබුණු අතර, ඉන්වෙන්ට්‍රි ලේඛනය, ඇප ලේඛනය හා හානි හා පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(i)	පොරොත්තු ලේඛනය	ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 4.3.4	පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/02
(ii)	ඉන්වෙන්ට්‍රි ලේඛනය	මුදල් රෙගුලාසි 715 (02) (ඉ)	යාවත්කාලීන කර නොතිබුණි. යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53
(iii)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි සංග්‍රහයේ 891 (ii)	යාවත්කාලීන කර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/02
(iv)	හානි හා පාඩු ලේඛනය	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීන කර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/08

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	එම වාර්තාවේ ඡේදයට යොමුව	වාර්තාව නිකුත් කළ දිනය
හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ ප්‍රධාන පිවිසුම අසල 2013 වර්ෂයේදී ඉදිකරන ලද වෙළඳ කුටි 12 ක් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	CPCG/KD/E/DNBG/154 (6)/C/2024/25	2024.05.14

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති එසීඒ - 3 ආකෘතිය මගින් දක්වා ඇති 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ වෙන්ත් මුලාශ්‍ර වලින් අග්‍රිම ලැබීම යටතේ රු.1,491,156,475 ක් ලෙස දක්වා තිබූ නමුත් වෙනත් මූලාශ්‍ර වලින් අග්‍රිම ලැබීම රු.1,492,131,001 වූයෙන් වෙනත් මූලාශ්‍ර වලින් අග්‍රිම ලැබීම අතර රු.974,526 ක වෙනසක් පැවතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ආ) මුදල් රෙගුලාසි 90 (4) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.974,526ක නොපියවූ අග්‍රිම ශේෂයක් පවතින අතර, විගණිත දින වූ 2025 මාර්තු 17 දින වන විටද ආයතනය විසින් පියවීමට කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

3.2 ආදායම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ රු.800,000,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.1,150,000,000 ක් ලෙස සංශෝධනය කර තිබීම හේතුවෙන්, මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර සියයට 44 ක විචලනයක් පැවැතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ආ) මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර වෙනස සියයට 44 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල ACA – 1 (ii) ආකෘතියේ මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලනතා පැහැදිලි කිරීම පිළිබඳ ප්‍රකාශනයේ එය සියයට 144 ක් ලෙස දක්වා තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ඇ) 2023 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු රු.3,691,000 ක හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

3.3 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.752,050,000 ක ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදන අතුරින් රු.60,377,823 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණද, ඒ තුල වැය විෂයයන් 17 ක සියයට 05 ත් සියයට 100 ත් දක්වා ප්‍රමාණයක් ඉතිරිවීම් පැවතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ආ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, පුනරාවර්තන වැය විෂයයන් 03 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.400,600,000 ක මුදලින් රු.29,350,000 ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 07 ක් වෙනත් වැය විෂයන් වෙත මාරුකර තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.156,500,000 ක ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදන අතුරින් රු.24,743,055 ක් හෙවත් ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 16 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. ඒ තුල වැය විෂයයන් 05 ක සියයට 07 සිට සියයට 29 දක්වා ප්‍රමාණයක් ඉතිරි වී පැවතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ඇ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, පුනරාවර්තන වැය විෂයයන් 03 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.400,600,000 ක මුදලින් රු.29,350,000 ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 07 ක් වෙනත් වැය විෂයන් වෙත මාරුකර තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

3.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

2024 වර්ෂය තුලදී මුදල් රෙගුලාසි 94 හා 2017 අප්‍රේල් 27 දිනැති 255/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 02 ඡේදයට අනුකූල නොවන ලෙස වැය විෂයන් 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.294,569 ක බැදීම් ඇතිකර ගෙන තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

3.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
(අ) 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය		උද්‍යාන 05 කට අයත් හෙක්ටෙයාර් 355.8744 ක වපසරියකින් යුතු ඉඩම් හා මහවැලි අධිකාරිය සතුව පවතින පුහුණු මධ්‍යස්ථානය හා වියලි කළාපීය උද්භිද උද්‍යානයට අයත් හෙක්ටයාර් 124.8423 ක වපසරියකින් යුත් ඉඩම් 02 ක්ද ඇතුළුව හෙක්ටයාර් 480.7167 ක ඉඩම් පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/08
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4, හා 6.3 වගන්ති	4,887,153	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විශ්‍රාම ගොස් ඇති, මියගිය, වැඩ තහනම් කළ හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 43 දෙනෙකුගේ ණය ශේෂයන් අය කර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/09
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
i. මුදල් රෙගුලාසි 102 (ඒ)		හානිය හා සම්බන්ධ පොත්පත්, වාර්තා ආදිය සුරක්ෂිතව තැබීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන යෙදිය යුතු වුවත්, කුරු නගුල හා තැටි නගුල සොරාගැනීම සම්බන්ධව පැවැත්වූ පරීක්ෂණ වාර්තාව හා පොලිස් වාර්තාව අස්ථානගතවී තිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/02

ii.	මුදල් රෙගුලාසි 104 (3)		හම්බන්තොට වියලි කලාපීය උද්භිද උද්‍යානයේ කුරු නගුල හා තැටි නගුල සොරා ගැනීම පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/02
iii.	මුදල් රෙගුලාසි 109 (ආ)	-	පොතෙන් අස් කිරීමේ සෑම නියෝගයකම පිටපතක් විගණකාධිපතිට යැවිය යුතු වුවද, දෙපාර්තමේන්තුවේ කුරු නගුලක් සහ තැටි නගුලක් පොතෙන් අස් කිරීමට අදාළ නියෝගයේ පිටපත් විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/02
iv.	571 (3) රෙගුලාසිය	6,742,723	කාලය ඉකුත් වූ තැන්පතු 19 ක් නිරවුල් කර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/08
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය		ආයතනය සතු වාහන 02 ක වර්ෂ 01 කට වැඩි කාලයක සිට ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. යොමුව - CPCG/KD/H/DNBG/2025/02

3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පේරාදෙණිය ලංකා බැංකු ණය්බාවේ පවත්වාගෙන යන ගිණුම් අංක 7040100 දරන ජංගම ගිණුමේ 2024 නොවැම්බර් 08 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව රු.1,265,208 ක හඳුනා නොගත් ගෙවීම් පැවතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ආ) ලංකා බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 7040100 දරන ගිණුම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයේ 2024 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය ශූන්‍ය වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති තත්ත්ව වාර්තාවේ ඇමුණුම viii හි රු.6,803,186 ක් ලෙස දක්වා තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත නිරීක්ෂණයන් කර්තු ලැබේ.

(අ) දෙපාර්තමේන්තු අරමුණු තුල ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ කටයුතු සිදුවිය යුතු බවට දක්වා තිබුණද, ගම්පහ ජාතික ශාකාගාරය සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පර්යේෂණ කටයුතු සැලසුම් කර් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ආ) උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ශාකාගාරය විසින් ලභාකර ගැනීමට අපේක්ෂිත අරමුණු විධිමත්ව ස්ථාපිත කර, එම අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් විධිමත්ව රාජකාරි ඇවරීමක් සිදුකර එයට අනුව වාර්ෂික මූල්‍ය ඇස්තමේන්තු හා තාක්ෂණික ක්‍රියාකාරී සැලසුම් සකස්කර ක්‍රියාත්මක කර එයට අනුකූල කාර්යසාධන දර්ශක සකස් කිරීමක් කළ යුතු නමුත්, මෙම අංශය තුල එවැනි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම්ද සපයා නොතිබුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ඇ) පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ජාතික ශාකාගාරය වෙනුවෙන් 2024 වර්ෂය සඳහා පිළියල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුල හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් 05 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා උද්භිද උද්‍යාන් හාර අරමුදලෙන් රු.6,500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ නමුත් එම ප්‍රතිපාදනය සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මගින් රු.10,220,000 ක් ලෙස සංශෝධනය කර ඒ අනුව රු.3,720,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා වැඩිවී තිබුණි. නමුත් ශාකාගාරයේ අරමුණු 03 ක් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිවෙලින් සියයට 32, සියයට 40 ක් සහ සියයට 65 ක් ලෙස අඩුකර තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/03

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඕකිඩ් තවාන, ඇන්තූරියම් තවාන, විසිතුරු තවාන හා පතොක් තවානෙහි පවත්න පැල වර්ගවල නාම පුවරු සවි කිරීම සමාලෝචිත වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 12 දින වන විටත් එම කාර්යයන් සිදුකර නොතිබුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

(ආ) සමාලෝචිත වර්ෂයේදී පටක රෝපණ ක්‍රමයට Gypsophila පැල 1000 ක් නිෂ්පාදනය කිරීමටත්, පටක රෝපණ ඕකිඩ් පැල 55000 ක් නිෂ්පාදනය කිරීමටත් ඉලක්කගත කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 12 දින වන විට ප්‍රගතිය පිළිවෙලින් සියයට 0 ත් සියයට 50 ත් අතර පැවතුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

4.2 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය 2023 වර්ෂය සඳහා පුද්ගලික අංශය මගින් ආරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා ක්‍රියාත්මක කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 (ආ) වගන්තියට අනුකූල නොවන පරිදි දෙවන අවම ලංසුව ඉදිරිපත් කළ ආරක්ෂක සේවය මිල ගණන්, ඔවුන්ගේ සේවා සැපයීම මිරිජ්ජවිල උද්භිද උද්‍යානය තුල සතුටුදායක නොවීම යන හේතුව හා පඩි පාලක සහා ආඥා පනතේ ගෙවීම් වලට සාපේක්ෂව අතාත්වික අපගමනයක් පෙන්වීම හා ඉහල වට්ටමක් ඉදිරිපත් කිරීම යන කරුණු පදනම් කරගෙන ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් නව කොන්දේසි අනුව ඇගයීම් කිරීම හා පඩි පාලක සහා ආඥා පනත- උල්ලංඝනය නොවීම හේතුවෙන් මෙම සැපයුම්කරු ප්‍රතික්ෂේප කිරීම සාධාරණ හේතුවකින් තොරව සිදුකර තිබුණි.

(ii) නෙවන අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු ඉහත දෙවන ලංසුකරු විසින් සේවා සපයන පුද්ගලයන් වෙත කරනු ලබන ගෙවීම්වලට සමානුපාතික ප්‍රමාණයන් ගෙවන බවට සඳහන් කර තිබියදී නෙවන සැපයුම්කරුගේ මිල ගණන් පිළිගෙන දෙවන සැපයුම්කරු ප්‍රතික්ෂේප කර තිබුණි.

(iii) මේ සම්බන්ධයෙන් 2023 නොවැම්බර් 30 දින අංක MT/IAI/3/1-2022 දරන සංචාරක අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන වාර්තාව අනුව ඉහත 02 ඡේදයෙන් සඳහන් කරුණු නිරීක්ෂණය කර අදාළ ප්‍රසම්පාදනය අවලංගු කර නැවත ප්‍රසම්පාදනය කරන ලෙසට නිර්දේශ කර අවස්ථා 02 කදී සිහි කැඳවීම් සිදුකර ඇතත්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/31

(ආ) කැබ් රථයක නකල් රේසරය හිරවීම සම්බන්ධයෙන් සිදුකරන ලද අළුත්වැඩියාවේදී දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව රු.50,000 ක උපරිමයක් දක්වා අළුත්වැඩියාවන් සිදුකර ගැනීමට බලය ලබාදී තිබුණද, 2022 සැප්තැම්බර් 20 දින සිදු වූ කැබ් රථයේ නකල් රේසරය අබලන්වීම සම්බන්දයෙන් සිදුකරන ලද අළුත්වැඩියාවේදී රු.60,650 ක අනුමත සීමාව ඉක්මවා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් පරිහාහිරව අළුත්වැඩියාව සිදුකර තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඇ) 2023 සැප්තැම්බර් 14 දින මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ දිග අඩි 1100 ක් උස අඩි 8 ක් වන දැල් වැටක් සවිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.3,841,200 ක (වැට් රහිත) මුදලකට පුද්ගලික සමාගමකට පිරිනමා එම ඉදිකිරීම 2023 නොවැම්බර් 07 දින අවසන් කර ඇති අතර, රු.4,417,380 ක (වැට් සහිත) මුදලක් ගෙවීම් කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාළ ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී අයිතම 04 කට අදාළව වෙළඳපළ මිල ගණන් ඉක්මවා රු.1,858,689 ක් අසාමාන්‍ය අගයක් ඇතුළත් කර තිබුණි.

යොමුව - CPCG/KD/E/AD/BW/2024/09

(ඈ) රාජකීය උද්භිද උද්‍යානයේ පිටවීමේ පර්යන්තයේ පිහිටි ගොඩනැගිල්ල ලක්සල ආයතනය වෙත බදුදීම පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 හා 2.5 වගන්ති අනුව ටෙන්ඩර් තීරණ සඳහා ප්‍රසම්පාදන කමිටු වගකිවයුතු වුවද, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ප්‍රසම්පාදන කමිටු තීරණයක් නොමැතිව 2023 ඔක්තෝබර් 25 දින දෙපාර්ශවය අතර පැවති රැස්වීම් වාර්තා පමණක් පදනම් කරගෙන 2023 දෙසැම්බර් 22 දින සිට 2033 දෙසැම්බර් 21 දක්වා අවුරුදු 10 ක කාලයකට බදුදීමට එකඟ වී වසර දෙකක කාලයකට ගිවිසුම් ගතවී තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) හි සඳහන් ප්‍රසම්පාදන අරමුණුවලට අනුව උපරිම ආර්ථික වාසි ලබාගත යුතු වුවද,උක්ත බදු ගිවිසුමෙහි 02 වන වගන්තියෙහි මාසික වාරිකය රු.412,500 ක් ලෙස දක්වා ඇති අතර, නව තක්සේරුව ලද පසු ඒ අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක්ද ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් හා නව තක්සේරුවක් ලබාගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 03 දිනැතිව තක්සේරු

දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ඇති වර්තමාන මාසික කුලිය වන රු.850,000 ක් අයකර ගැනීමේ අවස්ථාව අහිමිවීමෙන් 2025 වර්ෂය සඳහා රු.5,250,000 ක බදු කුලී ආදායමක් අහිමිවී තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4 වගන්තිය අනුව ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා කාර්යසාධන සුරක්ෂණය තබාගත යුතු නමුත්, උක්ත බදු දී ඇති දේපල සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලෙස රු.500,000 ක් මුදලක් මුදලින් තැන්පත් කිරීම 2024 අගෝස්තු 14 දින සිදුකර ඇති බැවින් කාර්යසාධන සුරක්ෂණය මුදලින් තැන්පත් කිරීමට ගිවිසුම්ගත වූ දින සිට මාස 08 ක කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

(iv) බදු ගිවිසුමෙහි 2 වන වගන්තිය ප්‍රකාරව දඩ මුදල් අයකළ යුතු වුවද, එම වගන්තිය ප්‍රකාරව ප්‍රමාද කාලය සඳහා රු.48,300 ක දඩ මුදල් අය කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/04

(ඉ) කැපටේරියා ආපනශාලාව 2024/2025 වර්ෂය සඳහා බදුදීම පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) එක් ව්‍යාපාර ආයතනයක් පමණක් මූලික ලංසු පරීක්ෂාවේදී තිබිය යුතු කොන්දේසි සම්පූර්ණ කර තිබුණද, එම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලංසුවේ ආහාරපාන සඳහා මිල ගණන් සැසඳීම සඳහා වෙනත් සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුවක් නොමැති බැවින් නැවත මිල ගණන් කැඳවීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් වාර්තාවෙන් නිර්දේශ කර තිබියදී එම නිර්දේශ නොසලකා ප්‍රතික්ෂේප වූ උපරිම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන 02 ක ලංසු ඇගයීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 වගන්තියේ ලංසුලේඛනවල කොන්දේසියක් ලෙස ඇතුළත් විශාල බැහැරවීමක් වන පුර්ව සුදුසුකම් ඉදිරිපත් කර නොතිබියදී නැවත එම ලංසු පිරිනැමීමට කටයුතු කිරීම ප්‍රසම්පාදන නියමයන්ගෙන් බැහැරව කටයුතු කිරීමක් වුවද, ලංසු කොන්දේසි පත්‍රයේ 6 (viii) පරිදි සමාන ව්‍යාපාර පවත්වාගෙනයාම සම්බන්ධයෙන් අදාළ පළාත් පාලන ආයතනයෙන් ලබාගත් තහවුරු ලේඛනවල සහතික කල පිටපතක් නැවත ඉදිරිපත් කරන බව දන්වා ලංසුකරුවකුට උපරිම ලංසුව රු.1,225,000 ක්ව තිබියදී රු.790,000 ක මාසික බදු මුදලකට ආපනශාලාව බදුදීමට රැස්වූ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එම නිසා රු.790,000 ක මාසික බදු මුදලකට බදුදීමට කටයුතු කිරීමෙන් 2024 මාර්තු මස 01 දින සිට 2025 පෙබරවාරි මස 28 දින දක්වා රු.435,000 බැගින් මාස 12 ක කාලයකට රු.5,220,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(iii) කැපටේරියා ආපනශාලාව වර්ෂයක කාලයකට බදුදීමට ලංසු කැඳවා තිබුණද, ලංසු කොන්දේසි පත්‍රයේ 14 (iii) වගන්තිය හා 14 (iv) වගන්තිය ගිවිසුමට ඇතුළත් කිරීම තුළින් වර්ෂයකට බදුදීම සඳහා ප්‍රසම්පාදන කැඳවීම් කර දීර්ඝ කාලීනව බදුදීමේ කොන්දේසි ගිවිසුමට ඇතුලත් කර ගිවිසුම්ගත වීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තියේ සඳහන් සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා සාධාරණ හා සමාන උපරිම අවස්ථාව ලබාදීමේ වගන්තියෙන් බැහැරව දිගින් දිගටම උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ආපන ශාලා බදුදීමේදී කටයුතු කර තිබුණි.

(iv) තාක්ෂණික ඇගයීම් කමිටුව සියළු ලංසු ප්‍රතික්ෂේප කරන ලෙස දන්වා තිබියදී, ටෙන්ඩර් ලියවිලි පසුව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීමෙන්ද, වැඩිම ලංසුවට වඩා සියයට 55 ක් අඩුමිල ලංසුවකට ටෙන්ඩරය පිරිනැමීමෙන්ද, අභ්‍යන්තර විගණන අංශයේ විගණන විමසුම මගින් උක්ත ආයතනය විසින් 2023/2024 වර්ෂය සඳහා කැපටේරියා ආපනශාලාව බදුදීම සම්බන්ධයෙන් ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩකිරීම සම්බන්ධ කරුණු වාර්තා කර තිබියදීත් ජයග්‍රාහී ලංසුකරු වෙත මෙම ලංසුව පිරිනැමීමේ අරමුණින්ම ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර ඇති බවට මතුවන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය.

යොමුව - CPCG/KD/H/DNBG/2025/04

(ඊ) සුහසාධක ආපනශාලාව බදුදීම පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තියේ ප්‍රසම්පාදන අරමුණක් වන සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා සමාන සාධාරණ හා උපරිම අවස්ථාව ලබාදිය යුතු වුවද, 2023 මාර්තු 21 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව අදාළ තෝරාගත් ලංසුකරු විසින් පලපුරුද්ද හෝ වර්තමාන ව්‍යාපාර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබියදීත්, 2023/2024 වර්ෂයේ ගිවිසුමේ 27 වන වගන්තිය උල්ලංඝනය කර තිබියදීත් 2023/2024 වර්ෂය සඳහා බදුදී තිබූ උක්ත බදුකරු වෙත 2024/2025 වර්ෂය සඳහා ලංසු කැඳවීමකින් තොරව 2024 ජූනි 13 දිනැති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් තීරණයකට අනුව සුහසාධක ආපනශාලාව බදුදීමට කටයුතු කර තිබුණි.

(ii) නව තක්සේරුව ලද පසු ඒ අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන්, 2024 දෙසැම්බර් 03 දිනැතිව රජයේ තත්සේරු දෙපාර්තමේන්තුවෙන් එවන ලද තක්සේරු වාර්තාවට අනුව මාසික තක්සේරු කුලිය රු.44,000 ක් වුවද, බදු ගිවිසුමහේ මාසික තක්සේරු කුලිය රු.40,975 කට එකඟවී වීමෙන් මාසිකව රු.3,025 ක් අහිමි වන අතර, 2024 ජූලි 01 සිට 2024 දෙසැම්බර් මස දක්වා මාස 06 කට රු.18,150 ක පාඩුවක් සිදුවී තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/04

(ඇ) 2024 ජූනි 01 සිට 2025 මැයි මස 31 දින දක්වා වසරක කාලයට කිරිහල බදුදීම පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 වගන්තිය අනුව ලංසු ලේඛනවල කොන්දේසියක් ලෙස සැලකූ විශාල බැහැරවීමක් වන පූර්ව සුදුසුකම් ඉදිරිපත් කර නොතිබියදී නැවත එම ලංසුව පිරිනැමීමට කටයුතු කිරීම ප්‍රසම්පාදන නියමයන්ගෙන් බැහැරව කටයුතු කිරීමත්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කිරිහල බදුදීමේ කොන්ත්‍රාත්තුව සඳහා නැවත මිල ගණන් කැඳවීම සුදුසු බව තීරණය කර තිබියදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි උපරිම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන 02 ක් වෙත ලංසු කොන්දේසි පත්‍රයේ 6 (viii) සඳහන් වූ සමාන ව්‍යාපාර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයෙන් ලබාගත යුතු වෙළඳ බලපත්‍රයේ සහතික කළ පිටපතක් නැවත ඉදිරිපත් කරන ලෙස ලිපියක් අදාළ ආයතනය වෙත යවා ඒ අනුව එදිනෙන් පසු 2024 පෙබරවාරි 13 දින ලබාගත් වෙළඳ බලපත්‍රයක් මත පදනම්ව පෞද්ගලික ආයතනයක් වෙත මසකට රු.786,700 කට ලංසුව පිරිනැමීමෙන් අනෙක් උපරිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය මාසික බදු මුදල වන රු.1,225,000 ක කුලිය ලබා ගැනීමේ අවස්ථාව අහිමිවී තිබූ අතර, ඒ හේතුවෙන් වසරකට ආයතනයට රු.5,259,600 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ii) කිරිහල බදුදීමේදී වර්ෂයක කාලයකට බදුදීමට ලංසු කැඳවා තිබුණද, ලංසු කොන්දේසි පත්‍රයේ 14 (iii) වගන්තිය හා 14 (iv) වගන්තිය ගිවිසුමේද ඇතුළත් කර තිබූ අතර, මෙසේ දීර්ඝ කාලීනව බදුදීමේ අරමුණින් කොන්දේසි ඇතුලත් කර ගිවිසුම්ගත වීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තියේ සඳහන් සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගිවීම සඳහා සාධාරණ හා සමාන උපරිම අවස්ථාව ලබාදීමේ වගන්තිවලින් බැහැරව කටයුතු කර තිබුණි.

(iii) නව තක්සේරුව ලද පසු ඒ අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන්, 2024 දෙසැම්බර් 03 දිනැතිව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවන ලද තක්සේරු වාර්තාව අනුව මාසිකව තක්සේරු කුලිය රු.800,000 ක් වුවද, බදු ගිවිසුමෙහි මාසික තක්සේරු කුලිය රු.786,700 කට එකඟවීමෙන් තක්සේරු වාර්තාව ලබාගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් මාසිකව රු.13,300 ක් හා 2024 ජූනි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මාස 07 ක කාලයක් සඳහා රු.93,100 ක බදු කුලී ආදායමක් අහිමිවී තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් සුවහස් මල් සංගම් වෙත බෙදා දීම වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු. 8,015 ක් වටිනා පොලිතීන් බෑග් 7000 ක ඌනතාවයක් පැවතුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

(ආ) සුවහස් මල්වගාකරුවන් වෙත බෙදා දීම සඳහා 2021 හා 2023 වර්ෂවල මිලදී ගෙන තිබූ රු.6,886,585 ක් වටිනා අයිතම 17 ක් අදාළ මල්වගාකරුවන් වෙත බෙදා දීමට කටයුතු නොකර වසර 01 ත් වසර 03 ත් අතර කාලයක් ගබඩා කර තිබුණි. තවද UV ප්‍රතිරෝධක පොලිතීන් හා සෙවන දැල් රෝල් 13 ක් දීර්ඝ කාලයක් අනාරක්ෂිත ලෙස තබා තිබුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

(ඇ) 2016 වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කළ වායුසමීකරණ යන්ත්‍ර 04 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර කාර්යාල ගබඩා තුල නිෂ්කාර්යව පැවතුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

(ඈ) මල් වගා පර්යේෂණ හා සංවර්ධන අංශයේ ඇන්තුරියම් ඒකකයේ සෙවන දැල් ගෘහ අලුත්වැඩියා කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.1,130,220 කට මිලදීගත් සෙවන දැල් (3m X 100m) 26 න් රු.695,520 ක් වටිනා සෙවන දැල් 16 ක් එනම් මිලදී ගත් ප්‍රමාණයෙන් සියයට 62 ක් අවුරුදු 07 කට ආසන්න කාලයක් ඇන්තුරියම් ඒකකයේ ගබඩාවේ නිශ්කාර්යව ගබඩා කර තිබුණි. තවද අංශය තුල සෙවන දැල් තිබියදී 2021 වර්ෂයේදී එම වර්ගයේම සෙවන දැල් රෝල් 13 ක් එකක් රු.3,297 බැගින් සුවහස් මල් වගාකරුවන්ට බෙදාදීම සඳහා මිලදී ගෙන තිබුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

(ඉ) ගම්පහ උද්භිද උද්‍යානයේ ගබඩාවේ රු.16,572 ක් වටිනා අයිතම 02 ක් වන ඩීසල් ලීටර් 9.5 ක් හා බූට්ස් ජෝඩු 06 ක ඌනතාවයක් පැවතුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ඊ) ගම්පහ උද්භිද උද්‍යානයේ ගබඩාව තුල 2013, 2015 හා 2017 වර්ෂවල මිලදීගත් වටිනාකම් සනාථ කර ගැනීමට නොහැකි වූ උපකරණ 16 ක් මාස 02 ත් මාස 04 ත් අතර කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණ අතර, අළුත්වැඩියා කිරීමටද කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(උ) ගම්පහ උද්භිද උද්‍යානයේ පැල තවානට අයත් නියැදියක් පරීක්ෂා කිරීමේදී පැල වර්ග 12 කට අදාළව රු.42,300 ක් වටිනා පැල 423 ක ඌනතාවයක්ද හා පැල වර්ග 03 කට අදාළව රු.3,700 ක් වටිනා පැල 37 ක අතිරික්තයක්ද පැවතුණි. තවද ඇන්තූරියම් හා ඕකිඩ් ගෘහයෙහි ලේඛනගත කර නොමැති උඩවැඩියා පැල මව් ශාක 594 ක අතිරික්තයක් හා 56 ක ඌනතාවයක්ද පැවති අතර, පැල ලේඛනයේ සටහන් කර නොමැති වර්ග 06 කට අයත් පැල 1170ක්ද පැවතුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ඌ) විධිමත් ඇගයීමකින් හා සැලැස්මකින් තොරව මුද්‍රණය කර තිබූ ශාක නාම පුවරු තොගයක් වසර 06 ක කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(එ) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ එල්ලෙන පාලම අසල ඇති උද්‍යාන පිවිසුම් මාර්ගය සහිත ඉඩමේ හෙක්ටයාර් 0.3658 ක පවරාගත් භූමියෙන් සියයට 68 ක් හෙවත් මෙම භූමියෙන් හෙක්ටයාර් 0.2513 ක් මේ වන විට අනවසර පදිංචිකරුවන් විසින් ස්ථිර ගොඩනැගිලි ඉදිකර භුක්තිවිදින බව අනාවරණය විය.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඒ) රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩාවක් තුල වසර 06 ත් 09 ත් අතර කාලයක සිට එකතුව රු.2,835,840 ක් වටිනා උපකරණ 02 ක් නිෂ්කාර්යයව හා ඌන උපයෝජිතව පැවතිණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඔ) 2019 වර්ෂයේ රාජකීය උද්භිද උද්‍යානයේ ඉදිකිරීමට යෝජිත නව ආපනශාලාව සඳහා මිලදී ගත් රු.23,700 ක් වටිනාකමැති මේස 03 ක්, වසර 05 කට ආසන්න කාලයක් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඕ) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවෙන් අංක A/31 699444 හා 2020 සැප්තැම්බර් දින රහිත නිකුත් කිරීමේ නියෝගයෙන් මෙලමයින් මේස 20 ක් ගබඩාව වෙත ලබාදී තිබූ අතර, ඉන් මේස 07 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට වසර 04 ක් නිෂ්කාර්යව ගබඩාවේ ගොඩගසා තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඔෆ) උද්භිද උද්‍යානය 04 ක් සතුව පවතින රු.15,080,380 ක් වටිනා ගොල්ෆ් කාර් රථ 08 ක් සහ වටිනාකම් හඳුනාගත නොහැකි ගොල්ෆ් කාර් රථ 02 ක් ඇතුළුව ගොල්ෆ් කාර් රථ 10 ක් මාස 01 ත් අවුරුදු 03 ත් අතර කාල පරාසයක් තුල භාවිතයෙන් තොරව පැවතුණි. ඒ හේතුවෙන් උපයාගත හැකිව තිබූ ගොල්ෆ් කාර් රථ ආදායම අහිමි වී ගොස් තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ක) සීතාවක තෙත් කලාපිය උද්භිද උද්‍යානයට අයත් හෙක්ටෙයාර 0.5015 ක ඉඩමක් හා හක්ගල උද්භිද උද්‍යානයට අයත් හෙක්ටෙයාර 49.564 ක ඉඩම් පිළිවෙලින් 2016 හා 1863 වර්ෂවල සිට අනවසර පදිංචිකරුවන් විසින් භුක්ති විඳින නමුත්, මෙම ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ග) ගම්පහ උද්භිද උද්‍යානය සතුව පවතින කැබ් රථයක් හා හක්ගල උද්භිද උද්‍යානය සතුව පවතින මෝටර් රථයක් අළුත්වැඩියා නොකර පිළිවෙලින් අවුරුදු 01 යි මාස 04 ක් සහ අවුරුදු 01 ක කාලයක් ගතවී තිබුණද, එම රථ අළුත්වැඩියා කටයුතු අවසන් කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ච) අනුක ජීව විද්‍යාගාරයේ නිස්සාරණය කරන ලද DNA සාම්පල පරීක්ෂා කිරීම සඳහා වසර 02 ක වගකීමකට යටත්ව රු.640,000 ක මුදලකට මිලදීගත් Page Unit උපකරණය අවුරුදු 02 ක් වූ වගකීම් කාලයෙන් එක් අවුරුද්දක් අවසන් වී තිබුණද මේ වන විට එක් පර්යේෂණයක් පමණක් සිදුකර තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/03

(ට) ශාකාගාරයේ වියලි නිදර්ශකයන්ට බාර්කෝඩ් ලේබල් යොදා ඩිජිටල් ඡායාරූපගත කිරීමේ අරමුණ වෙනුවෙන් කැමරා 02 ක් සහ Digitizing Copy Stand 02 ක් පැවතියද, 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එහි භාවිතය පරීක්ෂාවේදී ඩිජිටල් ඡායාරූපගත කිරීමේ ප්‍රගතිය 2021 සාපේක්ෂව සියයට 78 ක් අඩුවී තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/03

4.4 පාඩු හා හානි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව රජයට සිදුවූ හානියක් හෝ පාඩුවක් සිදුවූ වහාම එහි ප්‍රමාණය, හේතු, වගකිවයුතු පාර්ශවයන් කඩිනමින් හඳුනාගෙන රජයට සිදුවන හානිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. නමුත් ඇමුණුම (i) හි පාඩු හා අත්හැරීම් ප්‍රකාශනය තුළ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් පවතින අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති හානි හා පාඩු 26 ක් සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම එම හානි හා පාඩුවල අයකරගැනීමේ කාල විශ්ලේෂණයද මූල්‍ය ප්‍රකාශනය තුළ හෙළිදරව් කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ආ) ඇමුණුම (ii) මුදල් රෙගුලාසි 109 යටතේ පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනය තුළ සමාලෝචිත වර්ෂයේ පොත්වලින් කපා හැරීම හෙළිදරව් කළයුතු වුවත්, අවස්ථා 4 ක දී අයකර ගත් රු.2,724,486 මුදල අදාල වර්ෂයේ කපාහැරීම් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ඇ) එමෙන්ම 2025 ජනවාරි 03 දින පොතෙන් කපා හැරීමට අනුමැතිය ලබාදුන් වටිනාකම රු.60,650 ක් වූ ගම්පහ උද්භිද උද්‍යානයේ රථයක නිකල් රේසරය හිරවීම සම්බන්ධයෙන් පාඩුව සමාලෝචිත වර්ෂයේ පොතෙන් කපා හැරීමක් ලෙස වරදවා හෙළිදරව් කර තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

(ඈ) මුදල් රෙගුලාසි 104 (3) යටතේ අලාභයක් සිදුවූ වහාම එම අලාභයට අදාළ හේතු ඇතුළත් කරමින් අලාභය සිදුවූ දින සිට දින 07ක කාලයක් තුල පූර්ණ වාර්තාවන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් අලාභය සිදුවූ වහාම ප්‍රාරම්භක වාර්තා නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවද, හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානයේ 2010 දෙසැම්බර් 21 දින සිදුවූ කුරු නගුලක් සහ තැටි නගුලක් අස්ථානගතවී දැනට වසර 13 ක කාලයක් ගතවූ පසු ප්‍රාරම්භක වාර්තා නිකුත් කර තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඉ) 2024 ජූලි මස 10 දින දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ප්‍රාරම්භක වාර්තාව අනුව පෞද්ගලික ආරක්ෂක අංශයේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් දළ වශයෙන් ඇ.ඩො.50 ත් 100 ත් අතර වටිනාකමක් සහිත හාර්නස් උපකරණයේ කැරබිනා කොටස 2024 ජූනි 20 දින අස්ථානගතවී තිබුණි. අදාළ හානිය සිදුවී දැනට මාස 07 ක කාලයක් ගතවී තිබුණද, ඒ සම්බන්ධයෙන් මු.රෙ.104

(4) අනුව අවසන් වාර්තාවක් නිකුත් කර නොතිබුණි. එසේම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ වටිනාකම අයකර ගැනීමට විගණන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

4.5 අනාර්ථික ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ලක් විධිමත් තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව 2024 මාර්තු මස සිට දිනකට රු.200 ක් වැනි ඉතා සුළු මුදලක් අය කිරීමට තීරණය කර සුවහස් මල් වගාකරුවන් සඳහා පැල අලෙවිසැලක් පවත්වාගෙන යාමට ලබා දී තිබුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

(ආ) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ 2023 වර්ෂය සඳහා පුද්ගලික අංශය මගින් ආරක්ෂක සේවාව සැපයීම පිළිබඳව පරීක්ෂාවේදී ආරක්ෂක සේවාව සැපයිය යුතු ස්ථානයන් වශයෙන් හඳුනාගෙන නොතිබූ ප්‍රධාන ගේට්ටුව අසල බැටරි කාර් රථ රාජකාරී වශයෙන් ආයතනයේ මෙහෙයුම් කටයුත්තකට, ආරක්ෂක සේවයේ නිලධාරීනියක් සේවයේ යොදවා ඒ සඳහා රු.352,500 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. තවද ලංසු ආකෘති පත්‍රයේ 17 අනුව රාජකීය උද්භිද උද්‍යානයේ දිවා ආරක්ෂක සේවා සැපයිය යුතු ස්ථාන දක්වා තිබුණද, 2024 ජූනි 04 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී ආකෘති පත්‍රයේ දක්වා තිබූ ස්ථාන 03 ක ආරක්ෂක නිලධාරීන් යොදවා නොමැති බව නිරීක්ෂණය විය.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/31

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට 2025 අප්‍රේල් 22 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

යොමු - CPCG/KD/H/DNBG/2025/01
CPCG/KD/H/DNBG/2025/02
CPCG/KD/H/DNBG/2025/03
CPCG/KD/H/DNBG/2025/04

4.7 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වියළි කලාපීය උද්භිද උද්‍යාන මල් වගා අංශයේ පටක රෝපණ විද්‍යාගාරයේ මාධ්‍ය සැකසීම සඳහා යොදාගනු ලබන රු.25,889 ක් වූ රසායන ද්‍රව්‍ය 05 ක් භාවිතයට නොගැනීම මත කල් ඉකුත්වී තිබුණි. එසේම මෙහි ප්‍රාරම්භක වාර්තාව පරීක්ෂාවේදී මෙම රසායනික ද්‍රව්‍ය අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී නොගැනීම මත කල් ඉකුත්වී තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ආ) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ එල්ලෙන පාලම අසල ඇති උද්‍යාන පිවිසුම් මාර්ගය සහිත ඉඩමෙන් යටිතුවර ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත 2020 ඔක්තෝබර් 08 දින හෙක්ටයාර් 0.3658 ක භූමිය වාහන ගාල්කිරීම සඳහා පවරාදී වසර 04 ක කාලයක් ගතවී ඇතත්, මෙම ඉඩම ලබාගැනීමේ අරමුණ වෙනුවෙන් භාවිත කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතට අයත් අධ්‍යක්ෂ කාර්යාලයක් වශයෙන් පැවති මෙම ආයතනය 2006 නොවැම්බර් 10 දිනැතිව අංක 1471-2006 දරන සාමාන්‍ය ගැසට් පත්‍රය මගින් වෙනමම දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි. 2006 වසරේ සිට මේ වන විට වසර 18 ක් ගතවී ඇතත්, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල ඒ වන විට ස්ථාපිත කර තිබූ කෘෂිකර්ම අධ්‍යක්ෂ නිල නිවාසය හා කෘෂි ප්‍රකාශන ඒකකය, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඈ) මල් වගා පර්යේෂණ හා සංවර්ධන අංශය තුල කල් ඉකුත් වී භාවිතයට ගත නොහැකිව (ලේබල් රහිත) හඳුනාගත නොහැකි රසායන ද්‍රව්‍ය 37 ක්ද, කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය 69 ක් ද පැවති අතර, එම රසායන ද්‍රව්‍ය නිසි ක්‍රමවේදයන්ට අනුව බැහැර කිරීමට දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඉ) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය අනුව නිවාස කුලී අයකළ යුතු අතර 5.6 වගන්තීන් අනුව ආර්ථික කුලිය නියම කිරීමට ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලබාගත යුතුය. ඒ අනුව රාජකීය උද්භිද උද්‍යානය සතුව සේවක නිල නිවාස 18 ක් පවතින අතර, එම රජයේ නිවාස සඳහා රු.1,000 ක මාසික ආර්ථික කුලියක් අයවන බවත් මෙම ආර්ථික කුලිය 2016 දෙසැම්බර් 02 දිනැති ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කරගෙන අයකර තිබූ අතර, එම තක්සේරු

ඉදිරි වසර 02 ක කාලයක් සඳහා පමණක් වලංගුව පැවති බැවින් නව තක්සේරුවක් ලබාගත යුතු කාලය වසර 05 කින් ඉක්මවා තිබුණද, 2025 පෙබරවාරි 25 දින වන විටද ආර්ථික කුලිය තක්සේරු කර වාර්තාවක් ලබාදී නොතිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ සිට නව තක්සේරුවක් ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් නව තක්සේරුව අනුව රජයට ලැබිය යුතු නිවාස කුලී ආදායම අහිමිවී තිබුණි.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ඊ) 2022 වර්ෂයේදී රු.6,566,852 ක පිරිවැයකට වැසිකිළි පද්ධතියක් සමග ඉදිකර තිබූ රු.184,567 ක පිරිවැයකට නිමකර තිබූ ගබඩාවේ I Panel සිවිලිමේ කොටසක් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 13 දින වන විට ගැලවී ගොස් තිබුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(උ) ගම්පහ උද්භිද උද්‍යානයේ පටක රෝපණාගාරය තුල 2024 ජනවාරි සිට සැප්තැම්බර් 13 දක්වා කාලය තුලදී ඇන්තූරියම් පැල 1392 ක් හා ඕකිඩ් පැල 1312 ක් ද නිෂ්පාදනය කර ඇතත්, අදාළ පැල කුමන කාර්යය සඳහා නිකුත් කළේද යන්න හඳුනා ගැනීමට නොහැකි වූ බැවින් අධික වටිනාකමක් සහිත වගාවන් සම්බන්ධයෙන් පාලන ක්‍රමයක් හඳුන්වා දී පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් පැවතුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ඌ) තවාන් අංශය මගින් ලේඛනගත නොකර උද්‍යානයේ කටයුතු සඳහා නිකුත් කරන පැල සම්බන්ධයෙන් වූ පාලන ක්‍රමයක් නොතිබූ බැවින් විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා ලේඛනගත කිරීමේ අවශ්‍යතාවයක් පැවතුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(එ) පැල තවාන මගින් උද්‍යානයේ කටයුතු සඳහා පැල නිකුත් කිරීමේදී, අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගැනීම සඳහා පැල අවශ්‍යවන අංශයේ අංශභාර නිලධාරී විසින් අවශ්‍ය වන පැල වර්ගය සහ ප්‍රමාණය සඳහන් කරමින් ලිඛිතව ඉල්ලීමක් සිදුකිරීම හා අධීක්ෂණ නිලධාරී විසින් නිකුත් කරන පැල වර්ගය සහ ප්‍රමාණය සඳහන් කර එම නිලධාරියාගේ අත්සනින් යුක්තව නිවැරදි අධීක්ෂණයක් යටතේ පැල නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර දැනට පැල නිකුත් කිරීමේදී තවාන් නිලධාරීගේ අධීක්ෂණයකින් තොරව එක් එක් අංශවල සේවකයන් විසින් පැල රැගෙන යාම සිදුකර තිබුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ඒ) ගම්පහ උද්භිද උද්‍යානයේ පවතින ශාකාගාරයේ ගිනි උවදුරු ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ඔ) මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය තුල දැනට පර්යේෂණ 15 ක් ක්‍රියාත්මක වුවද, එම පර්යේෂණ පිළිබඳ තොරතුරු ඇතුළත් විධිමත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

(ඕ) විසිතුරු පැල ඒකකය, පතොක් පැල ඒකකය හා ඇන්තූරියම් ඒකකයේ විදේශීය ඇන්තූරියම් මව් ශාක එකතුවේ සහ ජලජ ශාක එකතුව සඳහා පැල ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

යොමුව - CPCG/KD/E/DNBG/C/2024/58

5. තිරසාර සංවර්ධනය

2024 වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව පිහිටුවා තිබූ තිරසර සංවර්ධන අරමුණු (SDG) 04 ක් සඳහා පිහිටුවා ඇති එක් එක් දර්ශකයන් සාර්ථක කර ගැනීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී දර්ශක 03 ක ප්‍රගතිය ඉලක්කයට 63 ත් ඉලක්කයට 80 ත් අතර විය.

යොමුව - CPCG/KD/H/DNBG/2025/08

6. මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 964 ක් වූ අතර, තක්සා කාර්ය මණ්ඩලය 736 කි. ඒ තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 08 ක් ද ඇතුළුව පුරප්පාඩු 178 ක් පැවති අතර, අතිරික්ත නිලධාරීන් 10 ක් විය.

යොමුව - CPCG/KD/H/DNBG/2025/02

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 193 වගන්තිය ප්‍රකාරව සෑම රජයේ නිලධාරියෙක්ම ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවද, ගම්පහ උද්භිද උද්‍යානයේ කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු ස්ථාන මාරුවීම් නොලබා මෙම උද්‍යානය තුල අවුරුදු 05 ත් 24 ත් අතර කාලයක් සේවයේ නිරතව සිටී.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

(ඇ) ගම්පහ උද්භිද උද්‍යානයේ 2024 වර්ෂයේ ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත් ගිවිසුමේ 22 වන වගන්තිය ප්‍රකාරව සේවයට බැඳෙන අවස්ථාවේදී සෑම ආරක්ෂක නිලධාරියෙක්ම ග්‍රාම සේවා සහතිකය, පොලිස් සහතිකය, උප්පැන්න සහතිකය, චරිත සහතික 02 ක් හා අධ්‍යාපන සහතික ලබා දිය යුතු බවට දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් සේවකයින් 17 දෙනෙකුගෙන් එම සහතික ලබාගෙන නොතිබුණි.

යොමුව - CPCG/KD/E/AD/CAD/2024/53

විගණකාධිපති